**2025.08.19 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේදී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගිත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
11. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී
12. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
13. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
14. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
15. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
16. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
17. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
18. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
19. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
20. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
21. බී. සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
22. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

සහභාගී නොවූ :-

1. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් 21 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

**ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරු, කරන්දෙනිය ප්‍රාදේශීය සභා ලේකම්තුමා, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද, මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**(අ). <u>පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම</u> :-**

(අ)(1). 2025.07.08 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවට සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

2025.07.08 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවට සංශෝධන ඉදිරිපත් නොවූ බැවින් සභා සම්මත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). <u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන</u> :-**

(ආ)(1). මේ දිනවල අප සභාවේ ලේකම් ධුරයේ රාජකාරී ඉටුකරනු ලබන කරන්දෙනිය ප්‍රාදේශීය සභාවේ ලේකම්, රවීන්ද්‍ර ලසන්ත මහතා අද දින සභාවේ ලේකම් ධුරයේ රාජකාරී සිදු කරන බවට ගරු සභාවට නිවේදනය කරමි.

(ආ)(2). "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නව සභිකයින් සඳහා පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් සම්බන්ධව" මැයෙන් මගේ අංක 1/2/1 හා 2025.08.15 දිනැතිව පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**(ඇ). <u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම</u> :-**

(ඇ)(1). "2019 වර්ෂයේ සිට වැඩි කරන ලද වරිපනම් බදු මුදල අඩු කිරීමට කරන ලද ඉල්ලීමට සාධාරණයක් ඉටු නොකිරීම සම්බන්ධයෙනි" යන මැයෙන් යුතුව බෙන්තොට, වරාහේන, ද අල්විස් පාර, කපිල කුමාර කොලොන්නේ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**(ඈ). <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> :-** නැත

**(ඉ). <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u> :-**

**(ඉ)(1). <u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u> :-**

(ඉ)(1)(1). බෙන්තොට බල ප්‍රදේශයේ පහත සංචාරක හෝටල් 09 සඳහා නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින් එම හෝටල්වලින් ලැබිය යුතු 1% බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට සාකච්ඡාමය එකඟතාවයක් ඇති කර ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- සී සැන්ඩ් රිසෝට් ලිමිටඩ්, "සෙන්ටාරා සී සැන්ඩ් රිසෝට් ඇන්ඩ් ස්පා"
- සෙරන්ඩිබ් හොටෙල් පී.එල්.සී.
- ලංකා අයිලන්ඩ් රිසෝට් ලිමිටඩ්.
- යුනයිටඩ් හොටෙල් කම්පැණි ලිමිටඩ්.
- එමරල්ඩ් බේ හොටෙල් ප්‍රයිවට් ලිමිටඩ්, "පැන්ඩනස් බීච් රිසෝට් ඇන්ඩ් ස්පා"
- සී/ස සමන් විලාස් සමාගම, "සමන් විලා"

- වානක් රොඩ්‍රිගු, “බාබරින් සෑන්ඩ්”
- බෙන්තොට මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්, “ක්ලබ් බෙන්තොට”
- සිලෝන් හොලිඩේ රිසෝට්, “සිනමන් බෙන්තොට බීච් හොටෙල්”

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

2016 ඉඳලා මේ දක්වා 1% ආදායම් මත බදු නොගෙවීම හේතුකොට ගෙන නඩු පවරලා තියෙනවා. නඩු පවරන කාල සීමාවෙත් මේ පිළිබඳ එකඟතාවයකට එන්න විවිධ ක්‍රම උපායන් අනුගමනය කරා. මේ වන විට බදු වශයෙන් පනත අනුව සමස්ථ ආදායමෙන් 0.01% ඉඳලා 1% දක්වා පරාසය තුළ ලබා ගැනීමට සභාවට තීරණය කළ හැකියි. පසුගිය කොවිඩ් කාලයේ දී මේක 0.5% සීමාවේ තැබුවා. මේ නඩු කටයුත්ත සඳහා නීතිඥ ගාස්තු විදියට අපිට සභාවක් විදියට රු. 5,000/- ක වගේ සුළු මුදලක් තමයි දරන්න වෙන්නේ. නමුත් හෝටල් සමාගම් කොළඹින් ජනාධිපති නීතිඥවරු සඳහා රු.150,000/- කට ආසන්න මුදලක් එක් නඩු වාරයකට දරනවා. අපිට බදු ගෙවනවට වඩා ඔවුන්ට නඩු කියන එක ලාභදායී. මේකෙන් වෙන්නේ අපිට බෙන්තොට ජනතාවට සේවය කරන්න ලැබිය යුතු බදු මුදල් නොලැබී යන එක. මේ නඩු අහන්නෙත් අවුරුද්දටම දෙපාරයි. සභාව දිනුවත් වෙන්නේ ඔවුන් ආපහු කොළඹ අභියාචනාධිකරණයේ නඩු කියනවා. එතකොට ආපහු නඩු කියන නිසා මේකෙ අවසානයක් වෙන්නේ නෑ. අපි බදු මුදල අඩු කරනකොටත් ගැටලුවක් මතු වෙනවා. දැනට 45කට 50කට පමණ ආසන්න පොඩි හෝටල්වලිනුත් අපි ලබා ගන්නේ 0.5% ක බදු මුදලක් ලබා ගන්නවා. බදු අඩු කිරීමේ දී හැම හෝටලයකටම සමානව ඒක අඩු වෙන නිසා අපිට මේ පොඩි හෝටල්වලින් ලැබෙන බදු මුදලත් අඩු වෙනවා. ඒ ගැනත් සලකා බලන්න වෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා විශේෂ සභාවක් කැඳවලා ඒකට අදාළ හෝටල් හිමියන්, අපේ සභාවේ අදාළ නිලධාරින් මෙන්ම නීතිමය පැතිකඩක් තිබෙනවනම් ඒ සම්බන්ධ නිලධාරීනුත් කැඳවලා මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා තීන්දුවකට එමු කියලා.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>

අදාළ හෝටල් 09 හි අයිතිකරුවන් ගෙවිය යුතු බදු මුදල යම්කිසි සීමාවක් දක්වා අරගෙන එම සීමාවෙන් ඉහළට ගෙවීමක් වෙනවා නම් ඒ අයට යම් ප්‍රතිශතයක් අඩු කරලා දෙමු.

<u>ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

මේ සම්බන්ධව සාකච්ඡාවකට යෑම සුදුසුයි. නමුත් එම හෝටල් යම්කිසි කාලසීමාවක් දක්වා බදු මුදල් ගෙවලා තමයි  බදු ගෙවීම පැහැර හැරලා තියෙන්නේ. ඒ නිසා බදු මුදල් පැහැර හරින්නත් යම් කිසි හේතුවක් ඇති. ඒ නිසා සභාව පැත්තෙනුත් වෙන්න ඕන කාර්යභාරය ඉටු වෙලා ද කියන එක පිළිබඳව අපි සැලකිලිමත් වෙන්න ඕන. ඒ වගේම දැනට අනෙක් බල ප්‍රදේශවල ගැටලුවක් නැතිව බදු මුදල් ගෙවන හෝටල් තියෙනවා. ඒ අයට මේක නරක පූර්වාදර්ශයක් වෙන්න ඉඩකඩකුත් පවතිනවා.

<u>ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා</u>

නදීශාන් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට එම හෝටල් හිමියන් සමඟ සාකච්ඡා කරලා අපිටත් පාඩුවක් නොවන ලෙස එම බදු මුදල් ලබා ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා</u>
මේ බදු මුදල් විවිධ ප්‍රදේශවල විවිධ ප්‍රතිශතවලින් අයකර ගන්නේ. ඒක ගැටලු සහගත තත්ත්වයක්. මං හිතනවා රටේම පොදු නීතියක් ගෙනල්ලා මේක සමථයකට පත් වුණා නම් හරි කියලා. මේ සම්බන්ධව ගැටලුව ඇතිවුණේ කොතනින්ද කියලා සලකා බලා හෝටල් හිමියන් සමඟ සාකච්ඡාමය එකඟතාවයකට යාම පිළිබඳ මාත් එකඟ වෙනවා.

බෙන්තොට බල ප්‍රදේශයේ ප්‍රධානතම සංචාරක හෝටල් 09 ක් සඳහා එම හෝටල්වලින් ලැබිය යුතු 1% බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට එම හෝටල් සමඟ සාකච්ඡාමය එකඟතාවයක් ඇති කර ගැනීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(1)(2). ප්‍රදේශයේ මාර්ගවල සුළු අලුත්වැඩියා කටයුතුවල දී පෙරමුසු (Primix) යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
වසර ගණනාවක් පුරා සභාවට අයිති මාර්ග බොහෝ ප්‍රමාණයක් අලුත්වැඩියා නොකිරීම මත දැඩිලෙස අබලන් වෙලා තියෙනවා. මේ අබලන් ස්ථානවලට ප්‍රිමික්ස් (පෙරමුසු) යෙදීමෙන් එම මාර්ග දීර්ඝ කාලයක් භාවිතයට ගන්න පුළුවන් හැකියාව පවතිනවා. පෙරමුසු කියුබ් එකක මිල රු. 90,000/- ක් පමණ වන නිසා හැම පාරකටම මේක කරන්න තරම් මුදල් සභාව සතුව නෑ. ඒ නිසා තාක්ෂණ සේවා නිලධාරීන් මඟින් සීමිත දිග ප්‍රමාණයක් සහිත අත්‍යවශ්‍ය සීමිත පාරවල් ප්‍රමාණයක් හඳුනාගෙන සංවර්ධනය කිරීම සුදුසු යැයි මම අදහස් කරනවා.

ප්‍රදේශයේ මාර්ගවල සුළු අලුත්වැඩියා කටයුතුවල දී පෙරමුසු (Primix) යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(1)(3). බෙන්තොට පාලම අසල නාගරික සංවර්ධන අධිකාරියෙන් අප හට පවරා ඇති භූමියේ හෙළ බොජුන් හලක් හෝ රමණීය වෙළඳසැලක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ ස්ථානය හෙළ බොජුන් හලක් ඉදි කිරීම සඳහා සුදුසුම ස්ථානයක්. නමුත් පොඩි ගැටලු වගයක් තියෙනවා. එතන වාහන ගාල් කරන්න තැනක් නෑ. පිටිපස්සේ තියෙන්නේ දුම්රිය මාර්ගය ඒවගේම ගඟ. ඉදිරියෙන් තියෙන්නේ ගාලු පාර. ඒ නිසා අනාරක්ෂිත බවක් තියෙනවා. නමුත් මේ අනාරක්ෂිත බව නොසලකා එතනට හවසට පිරිස් එකතු වෙනවා එතන සුන්දරත්වය විඳින්න. මෙතන වැඩ කරපු ආයතනයේ කට්ටිය අපිට කන්ටේනර් පෙට්ටියක් ලබා දීලා තියෙනවා. ඒක සකස් කරගෙන අපේ සභාවේ සුභසාධක සංගමය වෙත ලබා දෙමු. නැතිනම් හෙළ බොජුන් හලක් ආරම්භ කරමු. නැතිනම් අපි

කරන්නේ මාසෙකට 3,4 වතාවක් ගිහිල්ලා තණකොළ ටික සුද්ධ කරලා එන එක විතරයි. අපිට ආදායමකුත් නෑ. මන්ත්‍රීවරුන්ට විවිධ අදහස් හා යෝජනා ඇති, අපි සාකච්ඡා කරලා විශාල ඉදි කිරීමකට නොගිහින් දකුණු පළාතට පිවිසෙන ස්ථානයේ පිරිසිදුකම ආරක්ෂා වන පරිදි කුමක් හෝ වෙළඳසැලක් ඉදි කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
ඔබතුමාගේ යෝජනාවත් එක්ක මම එකඟ වෙනවා. එම ස්ථානයේ ජල හා විදුලි පහසුකම් සියල්ල හදාගෙන එම පරිසරයේ පිරිසිදුභාවය ආරක්ෂා කර ගනිමින් යම්කිසි අධීක්ෂණයක් යටතේ බෙන්තොට සභාවේ සුභසාධක සංගමයට දීම සුදුසුයි. මං මීට පෙර පැවති සභාවෙදිත් ඇහුවා එතනට ජලය ලබා ගන්න ෆෝවුන් එක සභාවේ නීත්‍යානුකූල ද, වරිපනම් බදු ගෙවන තැනක් ද කියන වග. නමුත් මට විසඳුමක් ලැබුණේ නෑ. එය නීත්‍යානුකූල නැතිනම් අපි එතනින් ජලය, විදුලිය ලබා ගැනීම සුදුසු නෑ.

<u>ගරු මන්ත්‍රී දිනේෂ් සේරසිංහ මැතිතුමා</u>
දෙපැත්තේ බැවුම් කොටසේ කණු මත ඉදිකිරීමක් කරලා ඉඩකඩ ගැටලුව හදාගන්න පුළුවන්. නමුත් පරණ පාලමේ තියෙන ගොඩක් ආරුක්කු දිරාපත් වෙලා නිසා ඒ ගැන ලොකු අවධානයක් දෙන්න ඕන. එන ජනතාව ඒ පැත්තට ගිහින් අනතුරක් වෙන්න පුළුවන්. ඒ වගේම ඒ ස්ථානයේ කලින් දිළිඳු පවුල් කීපයක්ම වෙළඳාම් කරා. නමුත් දැන් ඔවුන්ට ඒක නෑ. ඒ නිසා එතන වෙළඳසැල් ඉදි කරෝතින් එම දිළිඳු අඩු ආදායම්ලාභී පවුල්වලට ඒ වෙළඳසැල් ලබා දෙන්න කියලා ඉල්ලීමකුත් කරන්න කැමතියි.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
අපි මේ ස්ථානයට ජල විදුලි පහසුකම් ලබා ගන්නේ ජල සම්පාදනයෙන් හා විදුලි බල මණ්ඩලයෙන්. අපිට කන්ටේනර් එකේ ස්නැක් බාර් එකක් වගේ දාලා යම් දෙයක් කරන්න පුළුවන්. බංකු ඉදි කරලා තියෙන නිසා නැවත ඉදි කිරීමේ අවශ්‍යතාවයකුත් නෑ. සභාවේ සුභසාධක සංගමයට ලබා දී හෝ වෙනත් ආයතනයකින් යම් මුදලක් අයකර ගෙන හෝ ලබා දී ව්‍යාපාරික ස්ථානයක් ලෙස පවත්වා ගෙන යමු.

<u>ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>
යෝජනාව ඉතාම විශිෂ්ටයි. පළාත් කෘෂිකර්ම වැඩසටහන කරද්දි දේශපාලනික නිලධාරියා වශයෙන් කටයුතු කරපු නිසා මම මුල ඉඳලම ඕකට මැදිහත් වීමක් කරා. මෙහි ගැටලු කීපයක් පවතිනවා. ඒ ස්ථානයේ පිරිසිදුකම ආරක්ෂා කර ගන්න බැරි වෙනවා. ගඟට අපද්‍රව්‍ය එකතු වෙන එක වළක්වන්න බැරි වෙනවා. ඒ වගේම එම ස්ථානය කපුටන්ගේ, සුනඛයින්ගේ තෝතැන්නක් බවට පත් වෙනවා. ඒ වගේම මායිම් ප්‍රශ්නයත් බලපානවා. පාලමේ තදබදයක් ඇති වුණොත් ලොකු ගැටලුවක් ඇතිවෙයි. කෑම කන සෙනඟ ගැවසෙන කාර්යබහුල ස්ථානයක් බවට ඔතන පත් වුණොත් බෙන්තර තියෙන සුන්දරත්වයටත් හානියක් වෙයි. ජනතාව වැඩි ලෙසින් ගැවසෙන කයිකාවල නාන තටාකය අසල මෙවැනි බොජුන් හළක් ඉදි කරොත් ව්‍යාපාරික පැත්තෙනුත් හොඳ අවස්ථාවක් වෙයි. මගේ අදහස නම් මේක සංවේද පරිසර කලාපයක් නිසා අපි මෙම ස්ථානය ආකර්ශනීය සුන්දර තැනක් ලෙස පවත්වාගෙන යමු.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
හවසට සුන්දරත්වය විඳින්න එන පිරිස වැඩිපුර යොමු වෙන්නේ කෙටි ආහාර පාන ලබා ගන්න. ඒ නිසා උප සභාපතිතුමා අදහස් කළා වගේ ස්මාර්ට් ශොප් එකක් වගේ දෙයක් එතන ආරම්භ කිරීම සුදුසුයි. වාහන ගාල් කරන්න පරණ පාලම අසල ඇති කොටසත් භාවිත කරන්න පුළුවන්.

බෙන්තොට පාලම අසල නාගරික සංවර්ධන අධිකාරියෙන් අප හට පවරා ඇති භූමියේ හෙළ බොජුන් හළක් හෝ රමණීය වෙළඳසැලක් ඉදි කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු

සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(4). ගෝනගල පොදු වෙළඳ සංකීර්ණයේ අංක 09 කඩ කාමරය කඩ කාමර 03 ක් බවට පත් කළ යුතු යැයි ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
ගෝනගල වෙළඳ සංකීර්ණයේ සාමාන්‍යයෙන් දිගින් අඩි 33 ක් හා පළලින් අඩි 11ක් වන, කඩ කාමර 03 ක් එකට සම්බන්ධ කර ඇති කඩ කාමරය මේ වන විට දෙවරක්ම ටෙන්ඩර් කර ඇති නමුත් එහි වටිනාකම රු. 3,500,000/- කට ආසන්න නිසා මාසික කුළිය රු.35,000/- ක් පමණ වන නිසා කවුරුවත්ම අරගත්තේ නෑ. මේ කඩ කාමරය සුදුසු ෆුඩ් සිටියකට. නමුත් මේ ගොඩනැගිල්ල ඉදිරිපස මේ වන විටත් ෆුඩ් සිටියක් පවතිනවා. මේ කඩ කාමර හදලා පරිහරණයට නොගෙන සිටීම අපිට පාඩුවක්. ඒ වගේම විගණන ගැටලුත් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා මේ කඩ කාමරය බිත්ති 02 ක් මඟින් කඩ කාමර 03 ක් බවට පත් කරලා නැවත ටෙන්ඩර් කරලා ලබා දීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>
එම කඩ කාමර කාඩ්බෝඩ්වලින් වෙන් කිරීමේ හැකියාව පවතිනවා. ඒ වගේම එම කඩ කාමරය මූල්‍ය ආයතනයකටත් සුදුසුයි.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
පසුගිය දිනක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමකට දකුණු පළාතේ ප්‍රධානම රාජ්‍ය බැංකු දෙකේම කළමනාකාරවරු පැමිණ සිටියා. ඔවුන් පැවසුවේ අලුත් ක්‍රමවේදය යටතේ අලුතින් බැංකු ආරම්භ කිරීමට බලාපොරොත්තුවක් නැති බවත් ATM යන්ත්‍ර පමණක් ලබා දීමට හැකියාව පවතින බවත්. ඒ නිසා මේ ප්‍රදේශයට බැංකුවක් ලබා ගන්න බැරිවෙයි. මෙම කඩ කාමර බදු දෙන්නේ දීර්ඝකාලීනව. ඒ නිසා කාඩ්බෝඩ්වලින් වෙන් කරපු කඩ කාමර ගන්න කවුරුවත් කැමති වෙන්නේ නෑ.

ගෝනගල පොදු වෙළඳ සංකීර්ණයේ අංක 09 කඩ කාමරය කඩ කාමර 03 ක් බවට පත් කළ යුතු බවට ඉදිරිපත් වූ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(5). බෙන්තොට පාලමේ දකුණු පළාත් පිවිසුම අසල "සාදරයෙන් පිළිගනිමු - බෙන්තොට ප්‍රාදේශීය සභාව" මැයෙන් නාම පුවරුවක් සකස් කර සවි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
බෙන්තොටට පිවිසෙන ස්ථානයේ එය හඳුනාගන්න කිසිම දෙයක් එතන නෑ. ඒ නිසා ඉහත සඳහන් කළ වැකිය හෝ වෙනත් සුදුසු වැකියක් යොදා පුවරුවක් සකස් කිරීම සුදුසු යැයි මම යෝජනා කරනවා. ඒ

වගේම වෙනත් ආයතනවල අනුග්‍රහය ලබා ගැනීමේ හැකියාව පැවතුණත් එවිට එම ආයතනවල නම් පුවරුව යටින් සඳහන් වෙන නිසා අපේ අභිමානය පිළිබඳ ගැටලුවක් ඇති වෙනවා. ඒ නිසා සභා අරමුදලින් අපි මේ පුවරුව සකස් කරමු.

<u>ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>
වැදගත් යෝජනාවක්. අපි මේක රුහුණු සංචාරක මණ්ඩලය සමඟ කතා කරලා ඔවුන්ගේ උපකාර සමඟ කරමු.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
මම පුද්ගලික ව්‍යාපාර පවත්වාගෙන යන ආයතන කිහිපයකින් විමසීමක් කළා. ඔවුන් කැමති වුණා පුවරුවක් සකස් කරලා දෙන්න. නමුත් ඒ හැම ආයතනයකම යටින් අනුග්‍රහය කියලා ඒ ආයතනවල නම් සඳහන් කරනවා. ඒ නිසා එම ආයතනවලින් අපි බෙන්තොට අනෙක් මායිම් 02 වන කරන්දෙනිය මායිමටත් බලපිටිය මායිමටත් ඒ ආයතනවල අනුග්‍රහයෙන් පුවරු ලබා ගෙන ප්‍රධාන පිවිසුමට සභා අරමුදලින් පුවරුවක් සකස් කරමු.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
අනුග්‍රහය කියන වචනය නැතුව කෙටියෙන් ආයතනයේ නම තිබුණොත් ගැටලුවක් නැතිවෙයි.

බෙන්තොට පාලමේ දකුණු පළාත් පිවිසුම අසල සභාවේ නම යොදා පිළිගැනීමේ නාම පුවරුවක් සකස් කර සවි කිරීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(6). ගෝනගල පොදු වෙළඳ සංකීර්ණයේ අංක 08 කඩ කාමරය පළමු ලංසුකරු නොගන්නා බවට දන්වා ඇති බැවින් දෙවන ලංසුකරු වෙත ලබා දෙනවාද නැතිනම් නැවත එම කඩ කාමරය සඳහා ප්‍රසිද්ධ දැන්වීම් මඟින් මිල ගණන් කැඳවා ලබා දෙනවාදැයි සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේක ටෙන්ඩර් කරේ කොමසාරිස්තුමියගේ පාලන කාලයේ. අසීමිත මිල ගණන්වලට ටෙන්ඩර් ඉදිරිපත් කළත් මාසිකව වතුර බිල් ලයිට් බිල් සමඟ මාසිකව ගෙවිය යුතු මුදල වැඩි නිසා ඒ අය මේක ප්‍රතික්ෂේප කරා. ටෙන්ඩර් කැඳෙව්වෙත් අපි. අවසන් තීරණය ගන්න පුළුවන් වෙන්නෙත් සභාවට. මේ වෙනකන් අපි දෙවන ටෙන්ඩර්කරුගේ ඇප තැන්පතුව ආපහු ගෙවලත් නෑ. ඒ නිසා දෙවන ටෙන්ඩර්කරුට නෛතික කාරණාවක් තියෙනවා පළවෙනි කෙනා ගත්තේ නෑ. මං ඉල්ලුවට මට දුන්නෙත් නෑ. මගේ ඇප තැන්පතුව ආපහු දුන්නෙත් නෑ කියලා. අපේ අවම ලංසුවට වඩා රු. 1,261,000/- ක් වන දෙවන ලංසුකරු වන පුෂ්පා චාන්දනී මහත්මියගේ ලංසුව වැඩි නිසා මං යෝජනා කරනවා දෙවෙනි ලංසුකරුට අංක 08 කඩ කාමරය ලබා දීම සුදුසුයි කියලා.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
නැවත ටෙන්ඩර් කරොත් ඒ සඳහා ලොකු වියදමක් යන නිසාත්, ටෙන්ඩර් කරපු අවම ලංසුවට වැඩි මුදලක් ඉදිරිපත් කර ඇති නිසාත් දෙවන ටෙන්ඩර්කරුට ලබා දීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා</u>
මමත් අදහස් කරනවා දෙවන ලංසුකරුට කඩ කාමරය ලබා දීම සුදුසුයි කියලා.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
අපේ ටෙන්ඩර් ගාස්තුවට වඩා වැඩියෙන් ලබා දීලා තියෙනවා නම් පළවෙනි එක්කෙනා නොගන්නවා නම් අපි අනිවාර්යෙන්ම දෙවන ටෙන්ඩර්කරුට ලබා දීම සුදුසුයි.

ගෝනගල පොදු වෙළඳපොළ සංකීර්ණයේ අංක 08 කඩ කාමරය සඳහා දෙවන ලංසුකරු වන පුෂ්පා චාන්දනී මහත්මියගේ රු. 1,261,000/- ක ලංසුව පිළිගෙන ලබා දීම සුදුසු බවටගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථීරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(7). සභාවට අයත් අංක 14, මහගොඩ ග්‍රාම නිලධාරී වසමේ සිල්වර් ගාර්ඩ්න් ඉඩමේ ඉදිකර ඇති සිරි සිසිලිය සම්බෝධි විහාරස්ථානය බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීම සඳහා සභාවේ විරෝධතාවක් නොමැති බවට අවසර ලබා දෙන ලෙස එම විහාරාධිපති පූජ්‍ය බොන්දුපිටියේ සුමනවංශ ස්වාමීන් වහන්සේ විසින් ඉල්ලීමක් සිදු කර ඇත. ඒ සඳහා අවසරය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
ඕක ඉඩම් කට්ටි කරපු ඉඩමක ඉතුරු වෙච්ච කොටසක්. එම ප්‍රදේශයට පන්සලක් නැහැ. ඒ නිසා නීත්‍යානුකූල බව බලලා අවසර ලබා දුන්න නම් හරි.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
මෙම ස්ථානයේ පන්සලකට අවශ්‍ය හැම දෙයක්ම මේ වන විට තියෙනවා. ස්වාමීන් වහන්සේලා තුන් නමක් වැඩ වසනවා. බුද්ධ ශාසන අමාත්‍යාංශයේ අවසරය ගන්නනේ මේ හදන්නේ. ඒ නිසා අවසරය ලබා දුන්න නම් හරි.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>
මේ වන විට එම පන්සලේ දහම් පාසලක් පවත්වාගෙන යනවා. ළමයි 80 ක් විතර ඉන්නවා. පන්සල ලියාපදිංචි කිරීමට සභාවෙන් ලබා දිය හැකි අවසරය ලබා දෙන්න කියලා මං ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>
මේ ගැන තව අධ්‍යනය කරලා කටයුතු කරන්න වෙයි. මේ ස්වාමීන් වහන්සේ හැම තැනම කුඩා ඉඩම්වල පන්සල් හදමින් යනවා.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ කාරණාව මීට පෙර පැවති සභා වාර 02 කට ආවා. දැන් කොහොමත් ඔතන පන්සලක් තියෙනවා. දැන් වෙන පොදු කටයුත්තකට ඒ ඉඩම ඉල්ලුවත් අර ගන්න බෑ. ඔක්කොම ඩෝසර් කරන්න වෙනවා. මේ පන්සලෙන් ප්‍රයෝජන ලබන්නෙත් ගමේම අය. ඒ හින්දා අපි අපේ ඉඩමේ අයිතිය බැහැර නොකර එම ඉඩමෙහි පිඹුරු පත හා ලියාපදිංචිය සඳහා අවශ්‍ය සභවේ විරෝධතාවයක් නොමැති බවට අවසරය

ලබා දීමට කටයුතු කරමු. මේ සම්බන්ධව කොමසාරිස්තුමියගේ හෝ ආණ්ඩුකාරතුමාගේ උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වුණොත් ඒ උපදෙස් ලබාගමු.

සභාවට අයත් අංක 14, මහගොඩ ග්‍රාම නිලධාරී වසමේ සිල්වර් ගාර්ඩ්න් ඉඩමේ ඉදිකර ඇති සිරි සිසිලිය සම්බෝධි විහාරස්ථානය බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීම සඳහා සභාවේ විරෝධතාවක් නොමැති බවට අවසර ලබා දෙන ලෙස එම විහාරාධිපති පූජ්‍ය බොන්දුපිටියේ සුමනවංශ ස්වාමීන් වහන්සේ විසින් ඉල්ලීමක් සිදු කර ඇත. ඒ අනුව ඉඩමේ අයිතිය බැහැර කිරීමකින් තොරව සභාව තීරණය කරනු ලබන අවස්ථාවක ඉඩමේ භුක්තිය සභාවට කොන්දේසි විරහිතව පැවරීමේ කොන්දේසියට යටත්ව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව සිරි සිසිලිය සම්බෝධි විහාරස්ථානය බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(8). බෙන්තොට ප්‍රාදේශීය ලේකම්තුමා විසින් කහවෙගම්මැද්ද නෙළුම්පොකුණගම ගමට ප්‍රවේශ වන මාර්ගය හරහා ගලා බසින අගතුඩුව ඇළට යොදා ඇති බෝක්කුව වැසි දිනවල දී ජලය ගලා යාමට ප්‍රමාණවත් නොවන බැවින් බෝක්කුව හා මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇති අතර අඩි 8 දිග 1 ½ විෂ්කම්භය සහිත සිලින්ඩර් 04 ක් ඒ සඳහා යෙදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

කහවෙගම්මැද්ද නෙළුම්පොකුණගම ගමට ප්‍රවේශ වන මාර්ගය හරහා ගලා බසින අගතුඩුව ඇළට අඩි 8 දිග 1 ½ විෂ්කම්භය සහිත සිලින්ඩර් 04 ක් යෙදීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ සථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(9). බෙන්තොට ප්‍රාදේශීය ලේකම්තුමා විසින් 2025 වර්ෂයේ බෙන්තොට ප්‍රාදේශීය දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩ සටහනේ ජයග්‍රාහක සිසුන් සඳහා ත්‍යාග ලබා දීමට පිටු 120 CR පොත් 830 ක ප්‍රමාණයක් ඉල්ලුම් කර ඇත. ඒ සඳහා පොතක මිල රු. 280/- ක් වන ලෙස රු. 232,400/- ක දළ ඇස්තමේන්තුගත මුදල යටතේ සභා අරමුළදින් එම පොත් ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

අපේ ප්‍රදේශයේ දරුවන් තමයි මේ දහම් පාසල්වල ඉගෙනුම ලබන්නේ. දරුවන්ගේ හැකියාවන් එළිදක්වලා ත්‍යාග ලබා දීමක් තමයි මේකෙන් වෙන්නේ. ඉතිහාසයේ ඉඳන්ම බෙන්තොට ප්‍රාදේශීය සභාවෙන් මේ සඳහා පරිත්‍යාගයක් සිදු කරනවා.

2025 වර්ෂයේ පෙන්තොට ප්‍රා දේශීය දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහනේ ජයග්‍රාහක සිසුන් සඳහා ත්‍යාග ලබා දීමට පිටු 120 CR පොත් 830 ක් රු. 232,400/- ක දළ ඇස්තමේන්තුගත මුදල යටතේ සභා අරමුදලින් ලබා දීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(10). ටී. ඒ. ආනන්ද කපිල අල්විස් මහතා විසින් බෙන්තොට-අංගාගොඩ ගාලු පාර ආසන්නයේ බෙන්තොට ප්‍රාදේශීය සභාවට වම් පසින් ගාලු පාරට මුහුණලා තනා ඇති කඩකාමරය නැවත සභාවට පවරා නොගෙන ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු ඉටු කර ගැනීමට යළි ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. ඒ සඳහා සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ ඉදිකරන සැලැස්මේ තියෙනවා එම කඩය තිබෙන තැනින් ප්‍රවිෂ්ය මාර්ගයක්. දැන් තියෙන දොරටුවෙන් වාහන ඇතුළු වුණාම ඒවා නැවත පිටතට ගැනීමේ දී අවහිරතාවයක් ඇති වෙනවා.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
එතන තියෙන්නේ තාවකාලික කඩයක් නිසා එය ඉවත් කොට ප්‍රවේශ මාර්ගය සකස් කිරීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා</u>
සභාවේ අවශ්‍යතාවයට කටයුතු කරන්න කියන එක තමයි මගේ අදහසත්.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
ප්‍රවේශ මාර්ගයට ගන්න අවශ්‍ය කොටස අරගෙන ඉතිරි ටික කඩය පවත්වාගෙන යන්න ලබා දෙමු.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ සම්බන්ධව විවිධ මත ඉදිරිපත් වෙනවා. මෙම කඩ කමරය් බදු ගිවිසුම දීර්ඝ කිරීමට පක්ෂව අදහස් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු සභාවට දැනුම් දෙනවා.

බෙන්තොට අංගාගොඩ ගාලුපාර ආසන්නයේ බෙන්තොට ප්‍රාදේශීය සභාවට වම් පසින් ගාලු පාරට මුහුණලා තනා ඇති කඩ කාමරයේ බදු ගිවිසුම දීර්ඝ නොකිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(1)(11). බෙන්තොට ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොළ කඩ කාමර 05 සඳහා ඉදිරි වසර 03 ක් සඳහා වන වර්තමාන මාසික වෙළඳපොළ කුළිය ලෙස රු. 12,000/- ක් ලෙස තක්සේරු කර එවා ඇති බැවින් රු. 1,200,000/- ක එක්වන් මුදල යටතේ ටෙන්ඩර් කර 2026.01.01 දින සිට නව තක්සේරුව යටතේ කඩකාමර බදු දී ගිවිසුම් ගත කර ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුම වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
2025.12.31 දිනෙන් ගිවිසුම් කාලය අවසන් වන නිසා කඩ කාමර බදු දීම සම්බන්ධව චක්‍රලේඛ ප්‍රකාරව නව තක්සේරුව යටතේ ටෙන්ඩර් කිරීම සිදු කළ යුතුය.

බෙන්තොට ප්‍රාදේශීය සභා බෙන්තොට පොදු වෙළඳපොළ කඩකාමර 05 සඳහා රු. 1,200,000/- ක එක්වන් මුදල යටතේ ඉදිරි වසර 03 සඳහා ටෙන්ඩර් කර 2026.01.01 දින සිට නව තක්සේරුව යටතේ කඩ කාමර බදු දීමට ගිවිසුම්ගත කර ගැනීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)(2).** <u>**ගරු මන්ත්‍රී, නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා:-**</u>

(ඉ)(2)(1). තුඩුව පන්සල ඉදිරිපිට කජුගස්වත්ත මාර්ගය (350 m) තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
මේ මාර්ගයේ කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා හදනවා. එම මාර්ගයේ හබුරුගල කොට්ඨාශයට අයිති කොටස ප්‍රතිසංස්කරණය වෙන්නේ නෑ. ඇතුංගාගොඩට අයිති ටික විතරයි සංවර්ධනය වෙන්නේ. ගෙවල් තියෙන හරියේ පාර හැදෙන්නේ නෑ.

තුඩුව පන්සල ඉදිරිපිට කජුගස්වත්ත මාර්ගය (350 m) තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(2). උලුකැපුවත්ත ප්‍රධාන මාර්ගය (200 m) ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
මේක ගොඩක් මිනිස්සු යන එන පාරක්. ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන කිහිපයකුත් මේ පාරේ තියෙනවා. ගමන් කිරීම අපහසු පාරක් මේ.

උලුකැපුවත්ත ප්‍රධාන මාර්ගය (200 m) ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(3). සූරියගම පරුස්ස පාර (2 km) ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(4). සූරියගම වලගෙවත්ත හරස් පාර ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(5). කනහින්තොට ඇලකාක පාසල අසල (250 m) පමණ කාණු සහිතව ප්‍රතිසංස්කරණය හා එම මාර්ගයේ බෝක්කුව පිළිසකර කිරීම කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(6). හබුරුගල තුඩුව ගෝනගලපුර මාර්ගය (300 m) පමණ ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
හබුරුගල ඉඳලා ගොඩක් අය ගෝනගලට යන්නේ මේ මාර්ගයේ. ගොඩක් අබලන් වෙලා තියෙන්නේ.

හබුරුගල තුඩුව ගෝනගලපුර මාර්ගය (300 m) පමණ ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(7). හබුරුගල ධර්මරාජ විද්‍යාලය අසල සිට හබුරුගල සොහොන පාර (400 m) දක්වා තාර දැමීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(8). සූරියගම හරස් පාර (500 m) ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(9). හබුරුගල එම්. ඩී. පියසේන මාවත ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(10). හබුරුගල රයිගම්වත්ත පටු පාර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(11). සභාව සතු පොදු සුසාන භූමි සීමා සටහන් කර එළිපෙහෙළි කර නිශ්චිත වැඩ පිළිවෙළක් සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>

අපේ බල ප්‍රදේශයේ තියෙන ගොඩක් සොහොන් භූමිවල සීමා සටහන් වෙලා නෑ. හබුරුගල තියෙනවා සභාව සතු විශාල භූමි ප්‍රමාණයක සොහොනක්. නමුත් ඉතාම සුළු ප්‍රමාණයක් තමයි භාවිත වෙන්නේ. දෙද්දූවේ සෙහොනත් ඒ වගේමයි. පාරවල් මැකිලා ගිහින්. මිනිස්සු ඉඩම අල්ලගෙන. ඒ වගේම විවිධ විෂමාචාර සඳහා මේ ප්‍රදේශ යොදා ගන්නවා. අනිත් කාරණය තමයි සොහොනේ වළ දැමීමේ දී සභාවෙන් මුදලක් අය කරන බව ගොඩක් මිනිස්සු දන්නේ නෑ. හබුරුගල සොහොනේ ප්‍රවිෂ්ට මාර්ගයේ පවා මිනී වළ දාලා නිසා අක්කර 03 ක පමණ ප්‍රමාණයක් ගමන් කරන්න බැරි තත්ත්වයට පත්වෙලා තියෙනවා. ඒ නිසා සොහොන් බිම්වල මායිම් නිරවුල් කර ආරක්ෂිත වැටවල් ඉදිකර නඩත්තු කිරීමට වැඩපිළිවෙළක් යොදාගත යුතුයි.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>

සිංහරූපාගම සොහොනේ තත්ත්වයත් මෙ වගේමයි. පිටුපසට වෙන්න ඉඩ තිබුණත් කැළය වැවී ඇති නිසා භාවිතයට ගන්නේ නෑ. කැළය සුද්ද නොකර වැටක් ඉදිකරා. ගමේ පොදු දායකත්වයෙන් සිලින්ඩර් බස්සලා ළිඳක් හැදුවා. ඒ ළිඳත් ඇතුළ කරලා තමයි වැට ගැහුවේ. අවසානයේ වතුර ටිකක්වත් ගන්න බෑ දැන්. විසකුරු සත්තු පවා ගැවසෙනවා.

<u>ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා</u>

ඉතාම කාලෝචිත යෝජනාවක්. ඇලකාක පාසල අසල සොහොන සම්පූර්ණයෙන් පවිත්‍ර කිරීමේ අවශ්‍යතාවයක් පවතිනවා. පාසල් භූමියේ ආරක්ෂාව පිළිබඳ ගැටලුවක් තියෙනවා. පාසල් අවසන් වී යද්දි නොයෙකුත් අපචාරවලට ළමයි පොළඹවන්න උත්සහ කරනවා. ඒ නිසා ඇලකාක විදුහල අසල සොහොන එළිපෙහෙළි කිරීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා</u>
පසුගිය කාලයේ ඉඳුරුව ප්‍රදේශයේ සොහොන් බිම්වල සීමා මායිම් සටහන් කිරීමේ කටයුතු සිදු කළා. ඒ පිළිබඳ දැනගන්න අවශ්‍යයි.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 11.03 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

එහි දී ඉඳුරුව ප්‍රදේශයේ සොහොන් භූමි සීමා මායිම් සටහන් කිරීම පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට කළ යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 11.06 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

සභාව සතු පොදු සුසාන භූමි සීමා සටහන් කර එළිපෙහෙළි කර, සභාව සතු කම්කරුවන් ප්‍රමාණවත් නොවන බැවින් සභාවේ බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කර ලබා ගැනීමෙන් අනතුරුව හැකි පරිදි පවිත්‍රතා කටයුතු සිදු කිරීමටත් මිනී තැන්පත් කිරීම නිසා බැකෝ යන්ත්‍රයට ගමන් කළ නොහැකි ස්ථානවලට වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් කරන ලද සංශෝධිත යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(12). දෙද්දුව මහගෙදරවත්තේ සිට මහගහ දක්වා මාර්ගය පිළිසකර කර කාණු කැපීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(13). දෙද්දුව පන්සල පාරේ හරස් පාර 100 m පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(14). දංකැටිය කඩලගොඩ ප්‍රධාන මාර්ගය (1 km) ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(15). දෙද්දුව ප්‍රදේශයේ පානීය ජල ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ලැබෙන තුරු පානීය ජලය සැපයීම සඳහා දෙද්දුව ගහ අසල සිට දංකැටිය දක්වාත් මහගෙදරවත්ත ප්‍රදේශය ආවරණය වන පරිදිත් ටැංකි මඟින් ජලය බෙදා හැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>**

පෞද්ගලික සම්පත්දායකයින් සම්බන්ධ කර ගනිමින් හෝ මෙම ප්‍රදේශයට ජලය ලබා දීම අත්‍යවශ්‍ය කටයුත්තක්. මේ ප්‍රදේශයේ ගස් වැල් පවා ජලය නොමැතිව කහ පැහැයට හැරී තියෙන්නේ. මේ ප්‍රදේශයේ ගෙවල් 75 - 100 ක් වගේ ප්‍රමාණයක් තියෙනවා. වතුර ටැංකි 5 ක් වත් වුවමනා වෙනවා.

**<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

ටැංකි 5 කට ජලය සපයන්න අපිට හැකියාවක් නැතිවෙයි. අපේ ළිඳෙන් දිනකට ලබා ගන්න පුළුවන් වෙන්නේ ලීටර් 6000 ක් පමණ. මළ ගෙවල්, දානේ ගෙවල් වගේම සභාවට මුදල් බැඳලාත් විවිධ අවශ්‍යතා සඳහා වතුර බවුසරය වෙන්කර ගන්නවා. ඒ අවශ්‍යතා සඳහා ලබා දුන්නට පස්සේ දෛනිකව ජලය ලබා දෙන්න හැකියාවක් නැතිවෙයි. හැකි විදියට ජලය ලබා දීමට කටයුතු කරන්නම්.

ඒ අනුව දෙද්දූව ප්‍රදේශයේ පානීය ජල ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ලැබෙන තුරු පානීය ජලය සැපයීම සඳහා දෙද්දූව ගඟ අසල සිට දංකැටිය දක්වාත් මහගෙදරවත්ත ප්‍රදේශය ආවරණය වන පරිදිත් අත්‍යවශ්‍ය හදිසි අවස්ථාවක දී ජල ටැංකියක් ලබා දීමට සිදුකළ සංශෝධිත යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(16). හබුරුගල වොලිබෝල් පිටිය සභාවට පවරාගෙන නඩත්තු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>**

මේක තියෙන්නේ සභාව සතු ඉඩමක. ඉඩම් කට්ටි කරපු කොටසක හබුරුගල ධර්මරාජ කනිෂ්ට විද්‍යාලයට යාබදව පාසලේ පිට්ටනියත් එක්කමයි මේක තියෙන්නේ. 2018 වසරේ දී ඒක හබුරුගල යෞවන ක්‍රීඩා සමාජයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව යන දෙකේම අනුමැතිය ලබා දුන්නා. එහි ක්‍රීඩා භූමිය ඉදි කරන්න. එය සභාවට පවරාගෙන නඩත්තු කටයුතු සිදු කරමු.

හබුරුගල වොලිබෝල් පිටිය සභාවට පවරාගෙන නඩත්තු කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(17). කනහින්තොට වැල්ලතොටවත්ත මාර්ගය (100 m) ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
මෙය සංචාරක හෝටල් කිහිපයක්ම පවතින මාර්ගයක්.

කනහින්තොට වැල්ලතොටවත්ත මාර්ගය (100 m) ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(2)(18). බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් සඳහා ප්‍රමිතියෙන් යුතු විදුලි බල්බ යෙදවීම, විධිමත් වැඩපිළිවෙළක් සැකසීම මෙන්ම එම අලුත්වැඩියාවන් සිදු කරන අවස්ථාවේදී ගරු මහජන නියෝජිතයන්ට ඒ සඳහා සහභාගී වීමට අවස්ථාව සැලසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
බෙන්තොට ප්‍රාදේශීය සභාවේ විදුලි පහන්වලට අති විශාල මුදලක් මාසිකව වැය වෙනවා. සභාවක් විදියට ලයිට් 5,400 කට අධික ප්‍රමාණයක් මේ බල ප්‍රදේශයේ අපි නඩත්තු කරනවා. අපිට තියෙන්නේ එක ලයිට් වාහනයයි. මාසිකව වීථි පහන් නඩත්තු කිරීමට කොට්ඨාස මට්ටමින් වැඩ සටහනක් පහත පරිදි සකස් කරලා තියෙනවා.

| | |
|---|---|
| 01 වන සතියේ සඳුදා දින | - පහුරුමුල්ල |
| 01 වන සතියේ බදාදා දින | - බෝධිමළුව |
| 01 වන සතියේ සිකුරාදා දින | - දෝපේ |
| 02 වන සතියේ සඳුදා දින | - හබුරුගල |
| 02 වන සතියේ බදාදා දින | - ඇලකාක |
| 02 වන සතියේ සිකුරාදා දින | - මහගොඩ |
| 03 වන සතියේ සඳුදා දින | - ගෝනගල |
| 03 වන සතියේ බදාදා දින | - අතුරුවැල්ල |
| 03 වන සතියේ සිකුරාදා දින | - කයිකාවල |
| 04 වන සතියේ සඳුදා දින | - වරකමුල්ල |
| 04 වන සතියේ බදාදා දින | - මිරිමස්වත්ත |
| 04 වන සතියේ සිකුරාදා දින | - රන්තොටුවිල |
| 05 වන සතියේ සඳුදා දින | - ඌරගහ |

ඉහත සඳහන් දිනවල වෙනත් අත්‍යවශ්‍ය කටයුත්තක් යෙදුනොත් ඊට පසුදින එම කොට්ඨාශයේ විදුලි පහන් නඩත්තු කටයුතු සඳහා ලබා දෙනවා. නැතිනම් එම දිනවල සාමාන්‍ය පරිදි පැමිණිලි ලැබී ඇති පරිදි නඩත්තු කටයුතු සිදු කරනවා.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
අපි බෙන්තර කොටසට වැඩි ප්‍රමුඛතාවයක් දෙමු.

සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වැඩපිළිවෙළ අනුව මාසිකව කොට්ඨාස මට්ටමින් දින වෙන්කොට වීථි පහන් නඩත්තු කිරීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක්

නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

පෙ.ව. 11.25 ට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා සභාවෙන් පිට වී යාම නිසා ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා මූලාසනයට පැමිණ සභාව මෙහෙයවන ලදී.

**(ඉ)(3). ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(ඉ)(3)(1). ඇතුන්ගාගොඩ ග්‍රාම නිලධාරී වසමේ කනහින්තොට සිට ඇලකාක ග්‍රාම නිලධාරී වසමේ ඇලකාක දක්වා ඇති ඇල්පිටිය අලුත්ගම මාර්ගය සහ මහ ඌරගහ අලුත්ගම මාර්ගය යා කරන වික්‍රමාරච්චි මාවත මාර්ගය සංවර්ධනය කිරීමටත් එකී මාර්ගයේ කනහින්තොටින් මාර්ගය ආරම්භ වන ස්ථානයේ ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීමටත් ගරු සභාවට යේජනා කර සිටිමි.

මෙම යෝජනාව (ඉ)(2)(5) යටතේ ද ඉදිරිපත් වූ බැවින් එම තීරණය පරිදි කටයුතු කිරීමට ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(3)(2). වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ වියන්දූව කටුවත්ත මාර්ගයට මුහුණලා පිහිටි මරුමුල්ල කැළය නම් වූ කොටස් කර විකුණන ලද ඉඩමේ බෙන්තොට ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස ප්‍රදේශයේ දරුවන්ට ක්‍රීඩා කිරීමට ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමටත් එකී ඉඩමෙන් ඉවත් කරන පස් සභාවේ එකතු කරන ලද කසල වසා දැමීමට ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
පසුගිය දිනයක කසල අංගනයේ ඇති වූ ගින්න නිවා දමන්න සහයෝගයෙන් කැපවීමෙන් උදව් කළ සියලු දෙනාට ස්තූතියි.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
පසුගිය දිනවල කසල අංගනයේ ගැටලු සම්බන්ධයෙන් මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම මැදිහත් වෙලා හිටියා. මේ වන විට අපි හැම දෙනාගෙම උත්සාහය කැපවීම මත යම්තාක් දුරට ඒ කටයුතුවල හොඳ තත්ත්වයක් ඇතිවෙලා තියෙනවා.

වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ වියන්දූව කටුවත්ත මාර්ගයට මුහුණලා පිහිටි මරුමුල්ල කැළය නම් වූ කොටස් කර විකුණන ලද ඉඩමේ බෙන්තොට ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස ප්‍රදේශයේ දරුවන්ට ක්‍රීඩා කිරීමට ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමටත් එකී ඉඩමෙන් ඉවත් කරන පස් සභාවේ එකතු කරන ලද කසල වසා දැමීමට ලබා ගැනීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු උප සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(3)(3). රංතොටුවිල ග්‍රාම නිලධාරී වසමේ ගුරුහේන්ගොඩ අතුරු මාර්ගයේ ඉතිරි කොටස තාර දමා සංවර්ධය කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

රංතොටුවිල ග්‍රාම නිලධාරී වසමේ ගුරුහේන්ගොඩ අතුරු මාර්ගයේ ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(3)(4). මහ ඉඳුරුව ක්‍රීඩා පිටිය තුළ ඇති සතිපොළ එම ක්‍රීඩා පිටියෙන් ඉවත් කොට අතහැර දමා ඇති තුරුසෙවණ භූමියේ සතිපොළ ස්ථාපිත කිරිමටත් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
තුරු සෙවණ භූමිය අපට අයිති එකක් නෙවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පවරා ගැනීම් කටයුතු සිදු කරන්න ඕනේ.

ඉඳුරුව තුරුසෙවණ භූමිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සභාවට විධිමත් පරිදි පවරා ගැනීමෙන් පසුව එහි සතිපොළ ස්ථාපිත කිරීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු උප සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(3)(5). බෙන්තොට ප්‍රාදේශීය සභාව මඟින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු, ප්‍රතිසංස්කරණ කටයුතු, ඉදිකිරීම් කටයුතු ආදිය සභාවේ සෘජු ශ්‍රමය යටතේ කිරීමටත්, අවශ්‍ය අතිරේක ශ්‍රමය සහ අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, උපකරණ ආදිය දෛනික කුළී පදනම මත ලබා ගැනීමටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ පවත්නා කම්කරු ශ්‍රමය හා යන්ත්‍ර සූත්‍ර ධාරිතාවය සලකා බලා හැකි සුදුසු අවස්ථාවල සෘජු ශ්‍රමය පදනමින් ඉටු කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)(4). ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(ඉ)(4)(1). පහුරුමුල්ල මංගල මාවත දෙපස ගොඩවී ඇති කාණු පද්ධතිය පස් ඉවත් කර ඒ අවට කැළය සුද්ද කර නිසිලෙස ජලය බැස යන පරිදි කම්කරු මහතුන් යොදා සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය</u>
ඉදිරියට එන වර්ෂා කාලයට මේ මාවත වැසි ජලයෙන් යටවෙනවා කාණු පද්ධති අවහිර වීම නිසා. මේ වන විටත් මේ කාණු පද්ධතිය සුද්ද පවිත්‍ර කිරීමේ කටයුතු කෙරෙමින් පවතිනවා.

පහුරුමුල්ල මංගල මාවත දෙපස ගොඩවී ඇති කාණු පද්ධතිය පස් ඉවත් කර ඒ අවට කැළය සුද්ද කර නිසිලෙස ජලය බැස යන පරිදි කම්කරු මහතුන් යොදා සකස් කිරීමේ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු අප සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(2). පහුරුමුල්ල ආරච්චිවත්ත පාරේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කර කාණු පද්ධතිය සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(3). බෙන්තොට ගාලු පාරේ සිට රජ මාවතේ කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව. 11.38 ට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා නැවතත් මූලාසනයට පැමිණේ.

(ඉ)(4)(4). සෑම වර්ෂා කාලයටම තම නිවෙස් වැහි වතුරෙන් යටවීමේ අවදානමකට මුහුණ දෙන සිංහරුපාගම, කෝම්මල, ඔබඩවත්ත ජනතාව මහත් අසීරු තත්ත්වයකට පත්ව ඇති ඕඩක්කර ඇළ මාර්ගය සිංහරුපාගම කමල් මයාගේ ගැරේජ් එක ඉදිරිපසින් ආරම්භක ස්ථානයේ සිට බෙත්තාරාම පන්සල පිටුපස මාර්ගය දක්වා ද එතැන් සිට කේ. ඒ. ප්‍රේමසිරි මයාගේ නිවස දක්වා ඇති මෙම ඇළ මාර්ගය එක්ස්කැවේටරයක් දමා එහි ඇති මඩ සහ හබුරුපැළ ඉවත් කර ජලය බැස යන ආකාරයට කඩිනමින් සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය</u>
මේක ගඟට බැහැර වෙන්නේ යාත්‍රාමුල්ල, කෝම්මල, සුද්දගොඩ පාරේන්. මේක වාරිමාර්ගයට අයිති ඇළ මාර්ගයක්. මං ඉල්ලා සිටිනවා සභාව විසින් යෝජනාවක් කරන්න කියලා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. මේ ඕඩක්කර ඇළ සුද්ධ කරන්න කියලා. නැතිනම් කොච්චර කාණු පද්ධති පවිත්‍ර කරත් මේ ප්‍රධාන ඇළ මාර්ගය පවිත්‍ර නොකිරීමෙන් වර්ෂා කාලයට මුළු ප්‍රදේශයම යට වෙනවා.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
හරිම කණගාටුදායක තත්ත්වයක් එතන තියෙන්නේ පස් ගොඩ කරලා දාලා. සභාවක් විදියට අපිට තනිව කරන්න පුළුවන් දෙයක් නෙවෙයි මේක. අද දවසේ සභාවේ යෝජනාවක් විදියට සුළු වාරිමාර්ග යටතේ

පවිත්‍ර කරීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ලියුමක් යවමු. ඊට අමතරව ඊළඟ සම්බන්ධීකරණ කමිටුවේ දී ඔබතුමියගේ හෝ සභාවේ යෝජනාවක් විදියට මෙය ඉදිරිපත් කරන්න.

ඕඩක්කර ඇළ මාර්ගය පවිත්‍රතා සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ලිඛිතව ඉදිරිපත් කිරීමේ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(5). එහිම කොටසක් වන එම ඕඩක්කර ඇළ මාර්ගයට සම්බන්ධ වන සිංහරූපාගම සහ ඔබඩවත්ත කාණු පද්ධති වල් බිහිවී වතුර බැස නොයාම හේතුවෙන් ඩෙංගු අවදානමකට ද යොමුවන නිසා,

(i) ඔබඩවත්ත මාලා මියගේ (විදුහල්පති) නිවස අසල සිට සිංහරූපාගම කමල් මහතාගේ ගැරේජය අසල ඕඩක්කර ඇළ දක්වා ඇති කාණු පද්ධතිය යන්ත්‍ර උපකරණ මඟින් හෝ කම්කරු මහතුන් මඟින් වතුර බැස යන ආකාරයට සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ii) සිංහරූපාගම පද්මා මියගේ නිවස ආසන්නයේ දකුණුපස පාරේ දෙපස ඇති කාණු පද්ධතිය කුසුම්සිරි මයාගේ නිවස ආසන්නයෙන් අවසන් වන තැන දක්වා වතුර බැස යන ආකාරයට සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(iii) ඔබඩවත්ත අනුර වීරසිංහ මයාගේ නිවස අසල තුන්මං හන්දියෙන් වමට ඇති ප්‍රධාන මාර්ගයේ දෙපස කාණු පද්ධතිය ඕඩක්කර ඇළ මාර්ගය දක්වා ද වතුර බැස යන ආකාරයට සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(6). බෙත්තාරාම පන්සල පිටුපස ඇති කොන්ක්‍රීට් මාර්ගයේ ඉතිරි කොටස 75 m පමණ කොන්ක්‍රීට් අතුරා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(7). එම මාර්ගයේම "ඉඳුසර විලා" ආසන්නයේ සිට කේ. ඒ. ප්‍රේමසිරි මයාගේ නිවස අසල දක්වා ඇති මාර්ගය 100 m පමණ තාර හෝ කොන්ක්‍රීට් දමා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

බෙත්තාරාම පන්සල පිටුපස ඇති කොන්ක්‍රීට් මාර්ගයේ "ඉඳුසර විලා" ආසන්නයේ සිට කේ. ඒ. ප්‍රේමසිරි මයාගේ නිවස අසල දක්වා ඇති මාර්ගය 100 m පමණ තාර හෝ කොන්ක්‍රීට් දමා දෙන ලෙසට ගරු

සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(8). ඔබඩවත්ත “සීක්‍රට් හාබර් රෙස්ටොරන්ට්” ඉදිරිපිට ඇති ඔබඩවත්ත මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට අනුර වීරසිංහ මයාගේ නිවස අසල තුන්මං හන්දියෙන් වමට හැරී සිංහරූපාගම කම්මල දක්වා ඇති මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එම මාර්ගය තාර දමා කඩිනමින් පිළිසකර කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(9). ඔබඩවත්ත නිමාලි නානායක්කාර මියගේ නිවස අසලින් “ග්‍රේස් විලා” පිවිසුම් මාර්ගයේ සිට ඕඩක්කර ඇළ  මාර්ගය දක්වා ඇති මාර්ගය අබලන්ව ඇති බැවින් එයට තාර දමා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(10). සිංහරූපාගම සිරිසේන නානායක්කාර මහතාගේ නිවස ඉදිරිපිට වම් පසට ඇති ඩබ්ලින් මියගේ නිවසට යන මාර්ගයට තාර හෝ කොන්ක්‍රීට් අතුරා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>

මේ පාරේ නිවාස 6 ක් 7 ක් පමණ තියෙනවා. තාරවත් කොන්ක්‍රීට්වත් මේ පාරට දාලා නෑ. වැසි දිනවල ලෑලි දාලාවත් මේ පාරේ යන්න බෑ.

සිංහරූපාගම සිරිසේන නානායක්කාර මහතාගේ නිවස ඉදිරිපිට වම් පසට ඇති ඩබ්ලින් මියගේ නිවසට යන මාර්ගයට තාර හෝ කොන්ක්‍රීට් අතුරා දීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(11). සිංහරූපාගම ග්‍රාම නිලධාරී කාර්යාලය ඉදිරිපසින් පටන් ගන්නා කෝම්මල සුද්දගොඩ මාර්ගය පසුකර රවීන්ද්‍ර මහතාගේ නිවස අසල දක්වා ඇති ප්‍රධාන මාර්ගයට තාර දමා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(12). යාත්‍රාමුල්ල සමන්තික විජේසිංහ මයාගේ නිවස පසුකර පාසල්තොට මාර්ගයට තාර දමා දෙන මෙන් ගරු සභාවට යෝජනාකර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(13). අංගාගොඩ ගබඩාව පාර කැඩී ඇති තැන් තාර දමා පිළිසකර කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(14). අංගාගොඩ අවලා නිලන්ති මියගේ නිවස අසලින් ආරම්භ වන ෂෙල්ටෙල් කුළුණ දක්වා ඇති මාර්ගයට තාර හෝ කොන්ක්‍රීට් දමා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(15). බෙත්තාරාම පන්සල පිටුපස මාර්ගයේ පළවන වම්පසට ඇති මාර්ගය (100 m පමණ) කොන්ක්‍රීට් අතුරා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(16). බෙන්තොට වට රවුම් පාර, පිටාරඹ මාර්ගය සූරියගොඩ මාර්ගයේ සංචාරක හෝටල්, විලා, සංචාරක ආපනශාලා බහුලව ඇතත් වීථි ලාම්පු එළිය ප්‍රමාණවත් නොමැති බැවින් සංචාරකයන් රාත්‍රී කාලයේ ගමන් ගන්නා බැවිනුත් එම මාර්ගයන් සඳහා කෝබ්‍රා ලයිට් හෝ සෝලා ලයිට් සවි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
සංචාරක කලාපයේ පමණක් නොව ප්‍රධාන මංසන්ධිවලත් කල්පැවැත්මක් සහිත කෝබ්‍රා ලයිට් සවි කිරීම සුදුසුයි.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
මේක සංචාරක කලාපයක් නිසා කෝබ්‍රා ලයිට් යෙදීම සුදුසුයි. සංචාරකයන් රාත්‍රී 6,7 පමණ වන විට පාරේ ගමන් නොකරන තත්ත්වයකට පත් වෙලා තියෙනවා මාවත් කළුවර නිසා.

බෙන්තොට වට රවුම් පාර, පිටාරඹ මාර්ගය සූරියගොඩ මාර්ගයේ වීථි ලාම්පු එළිය ප්‍රමාණවත් නොමැති බැවින් එම මාර්ගයන් සඳහා කෝබ්‍රා ලයිට් යෙදීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු

සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(4)(17). මුහුදු වාරකන් අවසන් වී ඇති බැවින් එම වකවානුව තුළ වෙරළට ගොඩගසා ඇති ප්ලාස්ටික් බෝතල්, පොලිතීන් සහ අපද්‍රව්‍ය ගොඩගසා ඇති බැවින් සංචාරක මණ්ඩලය සහ වෙරළ ආසන්නයේ ඇති හෝටල් දැනුවත් කර බෙන්තොට වෙරළ තීරය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් සූදානම් කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
මේ ශ්‍රමදානය අදාළ සංචාරක හෝටල් හා අදාළ ආයතනයන් සමඟ එකතු වී සිදු කරමු. මොකද මේක විශාල කොටසක් ඒ නිසා සභාවට තනියම කරන්න බෑ.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
ඉදිරියේ දි පැවැත්වීමට නියමිත පළාත් පාලන සතියට සමගාමීව මෙම පිරිසිදු කිරීම් කරමු.

වෙරළට ගොඩගසා ඇති අපද්‍රව්‍ය සංචාරක මණ්ඩලය සහ වෙරළ ආසන්නයේ ඇති හෝටල් දැනුවත් කර බෙන්තොට වෙරළ තීරය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් පළාත් පාලන සතියේ දී සිදු කිරීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)(5). ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(ඉ)(5)(1). බෙන්තොට ප්‍රාදේශීය සභා සියලු නිලධාරීන්/ සේවකයන් සඳහා රාජ්‍ය සේවකයන් සඳහා දැනුවත් වීමට අවශ්‍ය වන ප්‍රධානතම නීති රීති පිළිබඳව දැනුවත් කිරීමේ කෙටි වැඩ සටහනක් පැවැත්වීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මෙය ඉතාම අත්‍යවශ්‍යයි. සමහර සේවකයන් සම්බන්ධ ගැටලු වල දී මේ නීති රීති පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය අඩු නිසා සිදු වන බව පෙනී යනවා.

බෙන්තොට ප්‍රාදේශීය සභා සියලු නිලධාරීන්/ සේවකයන් සඳහා රාජ්‍ය සේවකයන් සඳහා දැනුවත් වීමට අවශ්‍ය වන ප්‍රධානතම නීති රීති පිළිබඳව දැනුවත් කිරීමේ කෙටි වැඩ සටහනක් පැවැත්වීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ගරු සභාපතිතුමා විසින් ප්‍රශ්න විමසන ලදුව අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(5)(2). කෝම්මල-ආරච්චිමුල්ල පාරේ රන්දිදු පෙර පාසල ඉදිරිපිට ඇති හරස් මාර්ගයේ කෙළවර මීටර් 75 ක් පමණ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මේ පාරේ කොටසකට පමණයි කොන්ක්‍රීට් අතුරලා තියෙන්නේ. මිනිසුන් මේ නිසා දැඩි අපහසුතාවයකට පත්වෙලා තියෙනවා.

කෝම්මල-ආරච්චිමුල්ල පාරේ රන්දිදු පෙර පාසල ඉදිරිපිට ඇති හරස් මාර්ගයේ කෙළවර මීටර් 75 ක් පමණ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(5)(3). බෙන්තොට පාලම අසල උද්‍යානයේ හා කහඹිලියාකන්ද හංදියේ කසල බඳුන් 03 බැගින් ප්ලාස්ටික්, වීදුරු හා දිරන ද්‍රව්‍ය ලෙස නම්කර තැබීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මේකත් ඉතාම අත්‍යවශ්‍ය කාරණාවක්.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ කසල බඳුන් පළාත් පාලන සතිය වෙනුවෙන් වෙන් කරන ලද මුදල්වලින් ලබා ගෙන ස්ථාපිත කරමු.

බෙන්තොට පාලම අසල උද්‍යානයේ හා කහඹිලියාකන්ද හංදියේ කසල බඳුන් 03 බැගින් ප්ලාස්ටික්, වීදුරු හා දිරන ද්‍රව්‍ය ලෙස නම්කර තැබීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(5)(4). සියලු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් වහාම හිඟ වරිපනම් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(5)(5). අතුරු මාර්ගයන්හි දෙපස වැටවල් ආදිය සුදුසු ලෙස කපා නඩත්තු කිරීමට හා තම නිවෙස් ඉදිරිපිට මාර්ග පරිශ්‍ර පිරිසිදුව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් යෙදවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
සේවකයන් හිඟ නිසා අපිට මේවා සුද්ද කිරීම බරපතල ප්‍රශ්නයක්. නිවාසවල වැටවල්වලින් පාරට බර වුණු අතු ගොඩක් තියෙනවා. නිවාසවල ජනතාව දැනුවත් කිරීමක් කරලා, තම නිවෙස් පිරිසිදු කර ගන්න ලෙස දැනුම් දීම සුදුසුයි.

අතුරු මාර්ගයන්හි දෙපස වැටවල් ආදිය සුදුසු ලෙස කපා නඩත්තු කිරීමට හා තම නිවෙස් ඉදිරිපිට මාර්ග පරිශ්‍ර පිරිසිදුව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් යෙදවීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(5)(6). උග්‍ර ජල හිඟයෙන් පීඩා විඳින සෝනුත්තර මාවත රජසිරි උයන නිවාස සඳහා ජල සැපයුම් ලබා ගන්නා තුරු ප්‍රාදේශීය සභාව මඟින් ජල ටැංකියක් තබා ජලය සපයා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මේ හරියේ නිවාස 10 ක් පමණ ඉදිකරලා තියෙනවා. මේ අය ජල සම්පාදන මණ්ඩලයටත් දැනුවත් කිරීමක් කරලා තියෙන්නේ. ඒ නිසා ඒ අයට පානීය ජලය ලැබෙනකම් සභාවෙන් දිනක් හැර දිනක් වන සේ හෝ ජල ටැංකියක් තැබීම සුදුසුයි.

සෝනුත්තර මාවත රජසිරි උයන නිවාස සඳහා ජල සැපයුම් ලබා ගන්නා තුරු ප්‍රාදේශීය සභාව මඟින් ජල ටැංකියක් තබා ජලය සපයා දීමට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(5)(7). බෙන්තොට මහජන පුස්තකාලයේ පිරිසිදු කිරීම් (පඩිපෙළ, විදුලි පංකා පිරිසිදු කිරීම සහ ටයිල් බිම මොප් කිරීම) සඳහා සතියකට එක් දිනක් පිරිමි කම්කරුවෙකු අනුයුක්ත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
කාන්තා නිලධාරිනියන් දෙදෙනෙක් තමයි මෙතන ඉන්නේ. ඒ නිසා සතියකට එක් වරුවකට හරි පිරිමි කම්කරුවෙක් යොදා විදුලි පංකා ආදිය පිරිසිදු කරවීම සුදුසුයි.

බෙන්තොට මහජන පුස්තකාලයේ පිරිසිදු කිරීම් සඳහා සතියකට එක් දිනක් පිරිමි කම්කරුවෙකු අනුයුක්ත කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)(6). ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(ඉ)(6)(1). මිරිස්වත්ත, කොබෙයිදූව ප්‍රධාන මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය හා නැවත ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා</u>
මිරිස්වත්ත කොබෙයිදූව මාර්ගයෙත් ඇල්පිටිය ප්‍රධාන මාර්ගයෙත් මීටර් 50 ක 60 ක පමණ ප්‍රමාණයක් කාලයක් තිස්සේ අබලන්ව පවතිනවා. ඒ වගේම මහකුන්ද ප්‍රදේශයේත් කොටසක් දැඩි අබලන් තත්ත්වයේ පතිනවා. ඒ ස්ථාන 02 අලුතින් ඉදි කරන්න කියලා මං ඉල්ලනවා. පදිංචිකරුවන් 350 කට වැඩි ප්‍රමාණයක් භාවිත කරන මාර්ගයක්.

මිරිස්වත්ත, කොබෙයිදූව ප්‍රධාන මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය හා නැවත ඉදි කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(6)(2). ගා/ කොබෙයිදූව ප්‍රාථමික විද්‍යාලය පවත්වාගෙන යන භූමිය අධ්‍යාපන අමාත්‍යංශය වෙත පවරා දීමේ කටයුතු නැවත සක්‍රිය කර කඩිනමින් ඊට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා</u>
2012 දී ද්විතියික පාසල් ක්‍රමය යටතේ මිරිස්වත්ත මහ විද්‍යාලයේ 1 සිට 5 දක්වා පන්ති ඉවත් කරනවා. මේ නිසා ප්‍රදේශයේ ජනතාව විශාල අපහසුතාවයකට පත් වුණා. අවම කිලෝමීටර් 5,6 ගෙවාගෙන පාසල් වෙත දරුවන් යොමුකරන්න සිද්ධ වුණා. නමුත් ඒ පාසල්වලත් අවශ්‍ය පහසුකම් තිබුණේ නැති නිසා අපි අධ්‍යාපන අමාත්‍යංශය වෙත ඉල්ලීමක් කරා වගේම සම්බන්ධීකරණ කමිටු අනුමැතියෙන් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ එකඟතාවය මත ප්‍රාදේශීය සභාව සතු වෙන්දේසි ඉඩමක පොදු කොටසකින් අක්කරයකට ආසන්න ප්‍රමාණයක සමගාමී පන්ති 01 ක් පවතින සේ මේ ප්‍රාථමික පාසල ඉදි කරා. පසුව 2015 දී සමගාමී පන්ති 02 ක් පැවැත්වීමට අවසරය ලබා ගත්තා. අධ්‍යාපන අමාත්‍යංශයට පවරා ගැනීමට සියල්ල සකස් වෙමින් තිබිය දී සභාව විසුරුවා හැරීමත් සමඟ එම කටයුතු නැවතුණා. එම කටයුතු නැවත ආරම්භ කර පවරා ගැනීම් කටයුතු සිදුකරන මෙන් ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
මේ වන විට පාසල හා පෙර පාසල පිළිබඳ ශෝචනීය තත්ත්වයක් තියෙන්නේ. පෙර පාසල හා පාසල යන දෙකම පවත්වාගෙන යාමට දිය හැකි උපරිම සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලනවා.

ගා/ කොබෙයිදූව ප්‍රාථමික විද්‍යාලය පවත්වාගෙන යන භූමිය අධ්‍යාපන අමාත්‍යංශය වෙත පවරා දීමේ කටයුතු නැවත සක්‍රිය කර කඩිනමින් ඊට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ

බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**(ඉ)(7). ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(ඉ)(7)(1). මහගොඩ, මහගෙදරවත්ත සංවර්ධනය කළ ඉඩමේ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස ක්‍රීඩා පිටියකට සුදුසු අයුරින් සකසා දීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(7)(2). ඉන් ඉවත් කරන පස් ගෙන මහවිල ගමට පිවිසෙන ප්‍රධාන මාර්ගය දෙපස අඩි 03 බැගින් පුරවා දීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>
මහවිල ගමට යන්න තියෙන්නේ මේ පාර විතරයි. බර වාහනයක් යනවිට බයිසිකලයකටවත් පාරේ අයිනට කරලා ඉඩ දෙන්න විදියක් නෑ.

මහගොඩ, මහගෙදරවත්ත සංවර්ධනය කළ ඉඩමේ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස ක්‍රීඩා පිටියකට සුදුසු අයුරින් සකස් කිරීමේ දී ඉන් ඉවත් කරන පස් ගෙන මහවිල ගමට පිවිසෙන ප්‍රධාන මාර්ගය දෙපස අඩි 03 බැගින් පුරවා දීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ)(7)(3). බෝගහගොඩවත්ත සුසාන භූමිය නීත්‍යානුකූල කර ගැනීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>
මම ඉල්ලා සිටිනවා කාරක සභාවක් බවට පත් කරලා මේක ගැන කතා කරන්න කියලා. ඒක තාම සභාවට පවරගෙන නෑ. නමුත් ගම්වාසීන් කියනවා මේක සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියලා. මං දන්න තරමින් මේකේ මිනී තැන්පත් කරාට කිසිදු මුදලක් සභාවට ගෙවන්නේ නෑ.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.23 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

එහි දී එම සුසාන භූමියේ අයිතිය පිළිබඳව හා භූමි ප්‍රමාණය පිළිබඳ සාකච්ඡා කරන ලදී. ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට තීරණය විය.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට කළ යෝජනාව ගරු මන්ත්‍රී මන්ත්‍රී මිගාර වලල්ලාවි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.26 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

(ඉ)(7)(4). මහවිල පන්සල ඉදිරිපිට වෙල් යාය මැදින් ඇති සව්සිරිය ඉඩම් කට්ටියට පිවිසෙන මාර්ගය පස් යොදා පුරවා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>
ඉතා පටු නියරක් උඩින් තමයි මේ ඉඩමට යන්න තියෙන්නේ. ගෙවල් 15 ක් 20 ක් විතර මෙහි තියෙනවා. මහවිල පන්සල හා සම්බන්ධ වෙච්ච මිනිස්සු ඉන්නවා. දහම් පාසල් යන ළමයින් ඉන්නවා. ඒ නිසා ඒ අයට පහසුවක් වෙයි මේ ව්‍යාපෘතිය කරලා දුන්නොත්.

මහවිල පන්සල ඉදිරිපිට වෙල් යාය මැදින් ඇති සව්සිරිය ඉඩම් කට්ටියට පිවිසෙන මාර්ගය පස් යොදා පුරවා දීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාව සඳහා විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(7)(5). මහගොඩ 04 වන පටුමග ගමනාගමනයට සුදුසු ලෙස සාදා දීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

මහගොඩ 04 වන පටුමග ගමනාගමනයට සුදුසු ලෙස සාදා දීමට ඉදිරිපත් කළ යෝජනාව සඳහා විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(7)(6). බෝගහගොඩවත්ත පොදු ළිඳ පිරිසිදු කර භාවිතයට ගැනීමට සුදුසු ලෙස සකස් කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>
මේ බෝගහගොඩවත්ත කියන ගමට පැවිල්ලක් ආවම කන්ද ප්‍රදේශයේ ජීවත් වන පිරිසට වතුර නැති වෙනවා. මේ ළිඳ විතරයි භාවිත කරන්න තියෙන්නේ. දැනට මේක අභාවයට ගිහින් කඩා වැටිලා තියෙනවා. මං ඉල්ලා සිටිනවා සභාවෙන් මේක අලුත්වැඩියා කරලා භාවිත කිරීම සුදුසු ත්ත්තවයට පත් කරලා දෙන්න කියලා.

බෝගහගොඩවත්ත පොදු ළිඳ පිරිසිදු කර භාවිතයට ගැනීමට සුදුසු ලෙස සකස් කිරීමට ඉදිරිපත් කළ යෝජනාවට විරෝධතාවයක් හෝ බෙදීමක් ඇති නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)(8). ගරු මන්ත්‍රී, ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(ඉ)(8)(1). බෙන්තොට යාත්‍රාමුල්ල කොට්ඨාශයේ පහුරුමුල්ල වසමේ ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාංගනයට දැඩි අවශ්‍යතාවයක් වන විදුලිය ලබා දීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා</u>
දැනට විශාල පිරිසක් මේ ක්‍රීඩාංගනයේ ක්‍රීඩා කරනවා. ඒ ඉන්න අයගේ ලොකු ඉල්ලීමක් තමයි විදුලිය ලබා දෙන්න කියන එක. හවස 6.30 පමණ වන විට කළුවර වැටෙන නිසා අඳුරේ සෙල්ලම් කරන්න බෑ. ඒ වගේම ක්‍රීඩාංගනයේ යම් යම් ස්ථානවල කඩතොළු ඇතිවෙලා තියෙනවා.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මුළු පිට්ටනියටම විදුලිය සැපයීමේ හැකියාවක් නෑ වැයවන මුදලත් සමඟ. වොලිබෝල් පිටියකට අවශ්‍ය කොටසට පමණක් විදුලි ආලෝකය ලබා දීමේ හැකියාව පවතිනවා.

බෙන්තොට යාත්‍රාමුල්ල කොට්ඨාශයේ පහුරුමුල්ල වසමේ ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාංගනයේ වොලිබෝල් පිටියකට ප්‍රමාණවත් කොටසකට විදුලි ආලෝකය ලබා දීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඉ)(8)(2). බෙන්තොට සිංහරුපාගම (මද්දෙවෙල) පොදු සුසාන භූමිය බොහෝ කලක සිට වල් බිහි වී ඇති බැවින් එහි ඇති අනවශ්‍ය ගස් කපා එළිපෙහෙළි කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව (ඉ)(2)(11) යටතේ සාකච්ඡා කළ බැවින් එම තීරණය පරිදි කටයුතු කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).** **<u>යථා පරිදි කල් දී නොමැති යෝජනා</u>**

**(ඊ)(1). ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන කල් නොදුන් යෝජනා**

(ඊ)(1)(1). යාලේගම මිරිස්වත්ත ප්‍රධාන මාර්ගයේත් ගලගමට හැරෙන මාර්ගයේත් කොන්ක්‍රීට් මාර්ගය හරහා වැසි ජලය ගලා යන බැවින් මීටර් 30 ක් පමණ සහ දිග අඩි 01 යි අඟල් 06 ක් පමණ වන කොන්ක්‍රීට් කොටසක් ඉවත් කර සපත්තු කාණුවක් සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ)(2). ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන කල් නොදුන් යෝජනා**

(ඊ)(2)(1). රාජ්‍ය සේවා ක්‍රීඩා සතියට සමගාමීව බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සංවිධානය කරනු ලබන රාජ්‍ය නිලධාරීන්ගේ වොලිබෝල් තරඟාවලිය 2025.08.19 දින පැවැත්වීමට නියමිත බැවින් එහි සංග්‍රහ සඳහා ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහයක් ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමා අප වෙතින් ඉල්ලා ඇත. ඒ අනුව එම වැඩසටහනට සංග්‍රහ කටයුතු සඳහා සභා අරමුදලින් කිරි පැකට් 80ක් ලබා දීම සුදුසු බවටත් ඒ වෙනුවෙන් සභා අරමුදලින් රු. 8,800/-ක් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(2)(2). ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ)(සංශෝධිත) ප්‍රකාරව ජාතික කියවීමේ මාසය අරමුණු කර ගනිමින් බෙන්තොට ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් වෙනුවෙන් සභා අරමුදලින් රු. 525,000/- ක් දැරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(2)(3). රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ සියලුම පළාත් සභාවන්හි මෙහෙයවීමෙන් “පළාත් පාලන සතිය” වැඩසටහන 2025 සැප්තැම්බර් මස 15 දින සිට 21 වන දින දක්වා පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇති අතර එම වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත වැඩසටහන් ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනු ලබන අතර, උක්ත වැඩසටහන් සංවිධානය කිරීමට සභා අරමුදලින් රු. 300,000/- ක් දැරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

2025.09.15 දින ජංගම සේවා දිනය
2025.09.16 දින පරිසර හා රුක් රෝපණ දිනය
2025.09.17 දින සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය
2025.09.18 දින ආදායම් ප්‍රවර්ධන දිනය
2025.09.19 දින සාහිත්‍ය, අධ්‍යාපන සහ පුස්තකාල දිනය
2025.09.20 දින මහජන උපයෝගීතා දිනය
2025.09.21 දින ක්‍රීඩා දිනය සහ සහතිකපත් ප්‍රදානය

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(2)(4). ගෝනගල කඩ කාමර අංක 06 හා අංක 07 සඳහා ලංසුපත් කැඳවා මේ වන විට මාස 02 ක පමණ කලයක් ගත වී ඇති නමුත් වැඩිම ලංසු මුදල් ඉදිරිපත් කළ දෙදෙනා මෙතෙක් එම කඩ කාමර සඳහා එක්වන් මුදල් තැන්පත් නොකළ බැවින් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මේ කඩ කාමර ගත්ත අයට අපි ලිඛිතව දන්වලා යවලා තියෙනවා මුදල් බඳින්න ඕන අවසන් දිනය. නමුත් ඒ දිනයට පසුව තමයි මේ අය ඉල්ලීම් කරලා තියෙන්නේ කඩ කාමර අවශ්‍ය බව. නැවත ටෙන්ඩර් කැඳවන්න ගියොත් අපේ මුදල් හා කාලය වැය වීමක් සිදු වෙනවා. ඒ නිසා මම ගරු සභාවට යෝජනා කරනවා නීත්‍යානුකූලව ටෙන්ඩර් කරලා තියෙන නිසා වැඩිම ලංසු මුදල් ඉදිරිපත් කරලා තියෙන දෙදෙනාට ලබා දෙන්න කියලා.

යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(2)(5). සභාවේ සාමාන්‍ය මහ සභාව පැවැත්වෙන දිනවලදී සිදුකරනු ලබන සංග්‍රහ සඳහා සභාවේ අරමුදලින් වැය දැරීම සුදුසු බවටත්, එක් සභා වාරයක් වෙනුවෙන් රු. 15,000/- ක උපරිමයකට යටත්ව සංග්‍රහ වියදම් දැරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(2)(6). පළාත් නිශ්චිත ප්‍රධාන 2025 සහ ප්‍රාදේශිය සභාවේ සභා අරමුදල් යොදවා බෙන්තොට, හොරවල, තොටුපල හන්දියේ සිට තොටුපල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම සුදුසු බවටත්, ඒ වෙනුවෙන් වූ රු. 6,500,000/- ක් වූ ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවටත් මෙම කර්මාන්තය සීමිත ලංසු කැඳවීමේ ක්‍රමවේදය ඔස්සේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

පළාත් නිශ්චිත යටතේ රු. 3,650,000/- ක අරමුදලක් ලැබිලා තියෙනවා අඟල් 5 ක් උසට කොන්ක්‍රීට් දමන්න. නමුත් තාක්ෂණ සේවා නිලධාරීන් හා ප්‍රදේශයේ ජනතාව ප්‍රධාන ඉංජිනේරු ජයනන්ද මහතාට ඉදිරිපත් කර තිබූ අදහසක් අනුව නැවත මෙම ඇස්තමේන්තුව වෙනස් කරා අඟල් 6 ක් උස කොන්ක්‍රීට් දමන්න. හේතුව තමයි පාලම කැඩිච්ච දවසක ප්‍රධාන පාරක් ලෙසට මේ කියන පාර භාවිත වෙලා බර වාහන ගමන් කිරීමේ හැකියාවක් පැවතීම. ඉතිරි වියදම සභා අරමුදලින් දරා මෙම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>
මම ඔබතුමාගේ යෝජනාවත් සමඟ එකඟ වෙනවා. මේ පාරෙන් ගිහින් තොටුපළ හරහා ළඟා වෙන්නේ ඉත්තපානට. නමුත් ඉත්තපාන මාර්ගයේ අඟල් 5 කට තමයි පාර කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. ඒ පාරේ මේ වන විටත් බර වාහන ගමන් කරනවා. නමුත් පාරට හානියක් වෙලා නෑ. අලුත් පාළමක් හදන්න ලෑස්ති කරලා තියෙන්නේ. ඒ නිසා මගේ අදහස තමයි ලක්ෂ 65 කට ආසන්න මුදලක් මේ පාර සඳහා වැය කරන එක අපරාධයක්. අනික අලුත් පාලමට යන පාර වැටෙන්නෙත් මේ පාර හරහා. ඒ නිසා මේ පාර ටික කාලයකින් කඩලා දාන්න වෙනවා.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.44 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

එහි දී හොරවල තොටුපළ මාර්ගය පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව අහෝසි කිරීමට කළ යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.47 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(2)(7). මේ දිනවල අසනීප තත්ත්වයේ පසුවන ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා අද දින සභාවට නොපැමිණීම හේතුවෙන් එතුමාගේ නිඩාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ)(3). ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන කල් නොදුන් යෝජනා**

(ඊ)(3)(1). සුදුවැලිපොත මාර්ගයේ ගුරුකන්දගොඩැල්ල මාවතට පිවිසෙන පාරේ කාණු පද්ධතියට නව කොන්ක්‍රීට් ලෑලි 05 ක් දමා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(3)(2). අංක 10 සී ග්‍රාමසේවා වසමේ උඩුමුල්ල, මානාන පදිංචි සනත් ප්‍රියන්ත මහතාගේ නිවසට වැසිකිලි පහසුකම් ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(3)(3). කන්දෙමුල්ල, මහ ඉඳුරුව කුඹුලුන්ගොඩ මාර්ගය (වෙල මැදින් පාර) තාර හෝ කොන්ක්‍රීට් අතුරා පිළිසකර කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(3)(4). අංක 10 බී අකාඩේගොඩ ග්‍රාමසේවා වසමේ අකාඩේගොඩ මැදගොඩවත්ත ඉඩමේ නිවාස 7 කට පිවිසෙන මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා සකස් කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ)(4). ගරු මන්ත්‍රී, නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන කල් නොදුන් යෝජනා**

(ඊ)(4)(1). බෙන්තොට ප්‍රාදේශීය සභා ඉඳුරුව උප කාර්යාලයට පෞද්ගලික සම්පත්දායකයෙකු සම්බන්ධ කර ගනිමින් පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් අරම්භ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>
විදෙස්ගත ලාංකික කණ්ඩායමක් හා ඉඳුරුව ප්‍රදේශයේ පදිංචි පිරිසක් පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් ලබා දන්න එකඟතාවය පල කරලා තියෙනවා.

බෙන්තොට ප්‍රාදේශීය සභා ඉඳුරුව උප කාර්යාලයට පෞද්ගලික සම්පත්දායකයෙකු සම්බන්ධ කර ගනිමින් පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් අරම්භ කිරීම සුදුසු බවට ඉදිරිපත් කළ යෝජනාවට අදාළව ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(4)(2). බෙන්තොට කසල අංගනය සඳහා සීසීටීවී කැමරා පද්ධතියක් සවි කිරීමටත්, එම භූමියේ ප්‍රධාන පිවිසුමේ ගේට්ටුව සඳහා බෙන්තොට ගාමිණී විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය මඟින් තබා ඇති ඇප තැන්පතුවෙන් හා ඉතිරි මුදල් සභා අරමුදලින් දරා එම ගේට්ටුව තවත් අවශ්‍ය පමණ පුළුල් කර සෑදීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඊ)(4)(3). බෙන්තොට ආදාහනාගාරයට යාබද ප්‍රදේශයේ රථවාහන ගාල් කරන ඉඩමේ මෘතදේහ තැන්පත් කළ හැකි අවමංගල්‍ය උත්සව ශාලාවක් සැකසීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ)(6). ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන කල් නොදුන් යෝජනා**

(ඊ)(6)(1). බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගලි බවුසර් සේවය සඳහා සහ ආදාහනාගාර සේවාව සඳහා වර්තමානයේ ඉහළ මිල ගණනක් අය කරනු ලබන බැවින් පෙර සභාව අනුමත කර තිබූ මිල ගණන් වලටම එම සේවාවන් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 01.00 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

එහි දී එම ගාස්තු සංශෝධනය වීමට බලපෑ හේතු පිළිබඳව සාකච්ඡා කරන ලදී. සංශෝධනය කළ හැකි මට්ටමේ මිල ගණන් පවතී නම් ඒ ගැන නැවත සාකච්ඡාවක් සිදු කොට අවසන් තීන්දුවක් ලබා ගැනීමට එහි දී තීරණය විය.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 01.05 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

**(උ). කාරක සභා වාර්තා එම වේලේ ද සලකා බැලීම :-**

**(උ)(1). 2025.07.11 දින පෙ.ව 09.00 ට පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි**

සහභාගීත්වය -

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. කේ.ඩී.මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
4. ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
5. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
6. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී

පහත සඳහන් ගෙවීම් හදිසි අවශ්‍යතාවය මත ලේකම් තීරණයකින් ගෙවූ අතර මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 01 | කළමනාකරු, මහජන බැංකුව ගාල්ල ,පෝස්ට් මාස්ටර් ජනරාල්ගේ අංක 013-1001-99027346 ගිණුමට | තැපැල් මුද්‍රා යන්ත්‍රයට මුද්දර පහසුකම් ඇතුළත් කිරීම. | 20,000.00 |

**ගෙවීම් අනුමත කිරීම.**

පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | L 01 | ලංකා බැංකුවේ එම්.එස්. ගුණසේකර ගි.අ. 75548283 | ආපදා ණය ලබාදීම. | 342,250.00 |
| 02 | L 02 | ලංකා බැංකුවේ එම්.ඩබ්. අජිත් කුමාර ගි.අ. 77260604 | ආපදා ණය ලබාදීම. | 207,750.00 |
| 03 | L 03 | ලංකා බැංකුවේ පී.ඩී.ඩී.පී. කුමාරි ගි.අ. 83201774 | ආපදා ණය ලබාදීම. | 200,000.00 |
| 04 | 04 | එම්.ඩබ්. අජිත් කුමාර | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 19,839.58 |
| 05 | 05 | මුදිත ධර්ම ගුණසේකර | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 18,193.50 |
| 06 | 06 | ගාමිණී සමරවීරහෙට්ටි | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 11,550.00 |
| 07 | 07 | එම්.එස්.ඩී.චන්දිම ප්‍රියංකර | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 13,906.24 |
| 08 | 08 | කේ.අජිත් ජයරත්න | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 28,899.99 |
| 09 | 09 | එච්.ඒ.සුනිල් | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 18,354.16 |
| 10 | 10 | ගාමිණී අබේවික්‍රම | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 13,633.33 |
| 11 | 11 | ප්‍රේමදාස විමලසූරිය | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 14,178.99 |
| 12 | 12 | කේ.දුමින්ද විජේරත්න | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 3,061.87 |
| 13 | 13 | කේ.දම්මිත් | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 12,833.33 |
| 14 | 14 | ඩී.රාහුල | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 5,856.82 |
| 15 | 15 | චාමින්ද අබේවික්‍රම | 2025 ජුනි අතිකාල දීමනා ගෙවීම. | 5,458.33 |
| 16 | 16 | එම්.කේ.දර්ශන ප්‍රදීප් | 2025 ජුනි - අතිකාල දීමනා ගෙවීම. | 9,333.33 |
| 17 | 17 | එච්.එල්.වජිර රංජන් | 2025 ජුනි - අතිකාල දීමනා ගෙවීම. | 6,159.42 |
| 18 | 18 | ඉන්දික හෙට්ටිගොඩ | 2025 ජුනි - අතිකාල දීමනා ගෙවීම. | 4,678.45 |
| 19 | 19 | සුජීව සුදත් කුමාර | 2025 ජුනි - අතිකාල දීමනා ගෙවීම. | 1,543.09 |
| 20 | 20 | එම්.නිලංක | 2025 ජුනි - අතිකාල දීමනා ගෙවීම. | 11,916.66 |
| 21 | 21 | එස්.ඒ.දිනේෂ් සුරංග | 2025 ජුනි - අතිකාල දීමනා ගෙවීම. | 5,070.62 |
| 22 | 22 | කේ.ඕ.කේ.රවී | 2025 ජුනි - අතිකාල දීමනා ගෙවීම. | 9,347.24 |
18.2025.07.24 දිනැතිව සං/03 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මිරිස්වත්ත නිල සෙවණ ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරාගැනීම සඳහා මිරිස්වත්ත ගොවි සමිතිය, මිරිස්වත්ත සමඟි වැඩිහිටි සමිතිය හා මිරිස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉදිරිපත් කළ ඉල්ලීම් ලිපි මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අතරින් උක්ත ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා මිරිස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

19.2025.04.21 දිනැතිව අංක 3/2/ඝන අපද්‍රව්‍ය/2025 දරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය යටතේ කොම්පෝස්ට් අංගනය සඳහා මැෂින් සහ උපකරණ මිලදීගැනීමේ ව්‍යාපෘතියට අනුමත වී ඇති ලක්ෂ 25 ක මුදලින් ට්‍රැක්ටර් ටේලර් රථ 02 ක් මිලදීගැනීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

20.2025.05.15 දිනැතිව අංක 18/ප්‍රජා ජල දරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව දකුණු පළාත් සංවර්ධන

සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - ප්‍රජා ජල සම්පාදනය යටතේ හොරවල, දෙද්දුගෙවත්ත අද්දරවෙල පොදු ළිඳ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියට රු.100,000.00 ක මුදලක් අනුමත වී ඇති අතර ප්‍රජාපාදක සමතිවලින් එම ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා ඉල්ලීම් ලිපි තවදුරටත් ඉදිරිපත් නොවුවහොත් ප්‍රාදේශීය සභාව මඟින් ඉහත ව්‍යාපෘතිය සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

21.2025.07.25 දිනැතිව, රන්තොටුවිල සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව රන්තොටුවිල ආචාරියවත්ත වටරවුම් මාර්ගය තාරදමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඉටු කිරීමට තම සමිතියට හැකියාව හා පළපුරුද්ද ඇති බැවින් තම සමිතිය වෙත ලබාදෙන ලෙස ඉල්ලමින් රන්තොටුවිල සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය විසින් යොමු කර ඇති ලිපිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව උක්ත ව්‍යාපෘතිය සිදුකිරීම රන්තොටුවිල සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයට ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

22.2025.07.04 දිනැතිව, "JR 7724 ත්‍රීරෝද රථය සේවාකිරීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාවට අයත් JR 7724 ත්‍රීරෝද රථයේ වාර සේවාව එළඹ ඇති අතර අවසන් වරට සේවාකර නියමිත සේවා කාලය පසුවී ඇති බැවින් (1500 KM වැඩිපුර ධාවනය කර ඇත) එම ත්‍රීරෝද රථය පූර්ණ සේවා කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව උක්ත ත්‍රීරෝද රථයේ වාර සේවාව සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

01. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
02. කේ.ඩී.මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
03. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
04. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
05. බී.සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී

**(උ)(3). <u>2025.08.01 දින පෙ.ව 09.00 ට පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි</u>**

**සහභාගීත්වය**

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. කේ.ඩී.මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
7. උඩබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී

**01.** **<u>පෙර පාසල් නිල ඇඳුම් මසා නිමකොට ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**
මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/06/19 - 2025/07/07

| ද්‍රව්‍ය/ භාණ්ඩ/ උපකරණ සේවා විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | **A.K. Holding** ගාලුපාර අළුත්ගම | **T&D Fashion 130/17** කාල්ටන් සිටි, නාවින්න, උළුවිටිකේ. | **Feather Collection No.16/A,** මහින්ද මාවත, ගාල්ල. |
|---|---|---|---|---|
| බෙන්තොට ප්‍රා.ස. පෙර පාසල් දරු දැරියන් සඳහා නිල ඇඳුම් කට්ටල මසා නිමකොට ලබාදීම | කට්ටල **02** බැගින් | මිල (රු.) | මිල (රු.) | මිල (රු.) |
| ගැහැණු ළමුන් සාය හා ටී ෂර්ට් ලෙස සිසුන් **60** | **120** | 1,650/= | 1,600/= | 1,750/= |
| පිරිමි ළමුන් කලිසම හා ටී ෂර්ට් **94** සිසුන් **47** | **94** | 1,650/= | 1,600/= | 1,750/= |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුණි. මිල ගණන් සලකා බැලූ කමිටුව අදාළ ආයතන විසින් ඉදිරිපත් කර ඇති රෙදි සාම්පල හා මිල ගණන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒ සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති උළුවිටිකේ නාවින්න, කාල්ටන් සිටි, අංක 130/17 ලිපිනයේ පිහිටි T&D Fashion වෙතින් එක් කට්ටලයක් රු. 1,600/= මුදලකට ගැහැණු ළමුන් සඳහා කට්ටල 120 ක් ද, පිරිමි ළමුන් සඳහා කට්ටල 94 ක් ද මසා නිමකොට ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**02.** **<u>ප්‍රධාන කාර්යාලය සඳහා පාපැදියක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**
මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/06/19 - 2025/07/11

| අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | **Kumara Cycle,** මිරිස්වත්ත, බෙන්තොට. (රු.) | **Rajapaksha Cycle,** ගාලුපාර, බලපිටිය. (රු.) | **Shima Cycle Center,** මතුගම පාර, දර්ගා නගරය. (රු.) |
| ස්ටැන්ඩර්ඩ් පාපැදි | **01** | 48,000/= Lumala වගකීම අවු:03 | 50,000/= Lumala වගකීම අවු:05 | 49,000/= Lumala වගකීම අවු:10 |
| | | | | 39,000/= Hero වගකීම අවු:10 |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබූ අතර මිල ගණන් සලකා බැලූ කමිටුව එක් එක් ආයතන විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන්, ඒ සඳහා ලබා දී ඇති වගකීම් කාලය සහ

නිෂ්පාදිත මාදිලියන් පිළිබඳ පරීක්ෂා කිරීමෙන් අනතුරුව වෙළඳපොලේ පිළිගත් නිෂ්පාදිත මාදිලියක් වන Lumala පාපැදිය සඳහා වැඩි වගකීම් කාලසීමාවක් ලබා දී ඇති මතුගම පාර, දර්ගා නගරය ලිපිනයේ පිහිටි Shima Cycle Center ආයතනය වෙතින් රු. 49,000/= ක මුදලකට පාපැදියක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**03.** **<u>බෙන්තොට පොදු වෙළඳපොළ රථගාලට වාහන ඇතුළත් කිරීම පාලනය කිරීම සඳහා ආරක්ෂිත දම්වැල් වැටක් සවි කිරීම.</u>**
මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/07/14 - 2025/07/28

| අවශ්‍ය අයිතමයන් | අවශ්‍ය ප්‍රමාණය | නිව් ජයමාල් හාඩ්වෙයාර්, අඹගහහන්දිය, දර්ගානගරය. මිල (රු.) | අශ්ෆාක්ස් ට්‍රේඩ් සෙන්ටර්, මතුගම පාර, දර්ගා නගරය. මිල (රු.) | නිව් හාඩ්වෙයාර් ට්‍රේඩර්ස්, වැලිපැන්න පාර, අළුත්ගම. මිල (රු.) |
|---|---|---|---|---|
| **¾ යකඩ දම්වැල්** | **අඩි 140** | 850/= (1kg)<br>1kg = 7ft | 900/= (1kg)<br>1kg = 7ft | 1100/= (1kg)<br>1kg = 7ft |
| **සිමෙන්ති කොට්ට** | **01** | 1,750/= | 1,800/= | 2,000/=<br>(Tokiyo) |
| **8" විශ්කම්භය සහිත ප්ලාස්ටික් බාල්දි 02** | **බාල්දි 02** | 600/= | - | - |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03 ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුණි. මිල ගණන් සලකා බැලූ කමිටුව ඉහත සඳහන් අයිතමයන් 03 සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අඹගහ හන්දිය, දර්ගා නගරය ලිපිනයේ පිහිටි නිව් ජයමාල් හාඩ්වෙයාර් වෙතින් ¾ යකඩ දම්වැල් අඩි 140 ක් එනම් 20kg ක් රු. 17,000/= ටත්, රු.1,750/= ට සිමෙන්ති කොට්ටයක් සහ 8" විශ්කම්භය සහිත එක් ප්ලාස්ටික් බාල්දියක් රු. 600/= බැගින් බාල්දි 02 ක් රු.1,200/= ක මුදලකට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**04.** **<u>ඉඳුරුව පෙර පාසලෙහි වහලය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.</u>**
මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/07/09 - 2025/07/25

| අවශ්‍ය ද්‍රව්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | **Ashfaq's Hardware, Dharga Town** ඒකකයක මිල (රු.) | **Kamal Hardware, Maha Induruwa** ඒකකයක මිල (රු.) | **Perera Hardware, Warakamulla, Maha Induruwa.** ඒකකයක මිල (රු.) |
|---|---|---|---|---|
| **8'×3'** ඇස්බැස්ටෝස් ශීට් | **02** | 4,430/= | 4,420/=<br>(Ramco) | 4,450/= |
| රූෆ් බෝල්ට් ඇණ | **50** | 35/= | 35/= | 40/= |
| මුදුන් උළු කැට | **10** | 140/= | 130/= | 140/= |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුණි. මිල ගණන් සලකා බැලූ කමිටුව එක් එක් ආයතන අතුරින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ මහ ඉඳුරුව, ජෝර්සිගොඩ ලිපිනයේ කමල් හාඩ්වෙයාර් ආයතනය වෙතින් 8'×3' ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් ශීට් 01 ක් රු.4,420/= (Ramco) බැගින් ශීට් 02 ක් රු. 8,840/= මුදලකට සහ රූෆ් බෝල්ට් ඇණයක් රු. 35 බැගින් ඇණ 50 ක්

රු. 1,750 මුදලකට සහ එක් මුදුන් උළු කැටයක් රු. 130/= බැගින් කැට 10ක් රු.1,300/= ක මුදලකට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**05. <u>ධාවනයෙන් ඉවත්කර ඇති අංක JT8414/ RW 8251 දරණ ට්‍රැක්ටර් ටේලර් රථ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය යකඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/06/19 - 2025/07/11

| අවශ්‍ය ද්‍රව්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | කඹුරාවල ස්ටෝර්ස් , අංක 370, ගාලුපාර, දකුණු කළුතර, මිල (රු.) | නිව් LMD හාඩ්වෙයාර්, සිරි සරණංකර මාවත, දකුණු කළුතර. මිල (රු.) | ශාන්ත ඉනුමුන්ට්ස්, අංක 358, කුරුඳුවත්ත, දකුණු කළුතර. මිල (රු.) |
|---|---|---|---|---|
| **8"×4" ප්‍රමාණයේ යකඩ තහඩු ශීට් (ගේජ් 18)** | **03** | 16,500/= 2MM MS | නොමැත. | නොමැත. |
| **4"ප්‍රමාණයේ U හැඩැති යකඩ අඩි 12** | **01** | 2×46 mm 25,000/=<br>2×45mm 19,000/= | 26,000/= | 26,250/= |
| **3"ප්‍රමාණයේ U හැඩැති යකඩ අඩි 12** | **01** | 3×1 ½ 6mm 20,000/=<br>3×1/2 5mm 15,000/=<br>ප්‍රවාහනය සඳහා 4,500/= | 21,000/= ප්‍රවාහන පහසුකම් නැත. | 21,300/= ප්‍රවාහන පහසුකම් නැත. |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුණි. අදාල ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සලකා බැලූ කමිටුව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ දකුණු කළුතර, අංක 370, ගාලුපාර ලිපිනයේ පිහිටි කඹුරාවල ස්ටෝර්ස් වෙතින් 8′×4′ ප්‍රමාණයේ තහඩු ශීට් 03 (ගේජ් 16) රු. 16,500 බැගින් ශීට් 03ක් රු. 49,500/= වත්, 4" ප්‍රමාණයේ U හැඩැති යකඩ අඩි 12 ක් (2×4 - 6mm) රු. 25,000/= ක මුදලකටත්, 3" ප්‍රමාණයේ U හැඩති යකඩ අඩි 12 ක් (3×1 ½ 6mm ) රු. 20,000/= ක මුදලකටත්, ප්‍රවාහන ගාස්තු රු. 4,500/= ට අදාළ ද්‍රව්‍ය සභාව වෙත ප්‍රවාහනය කර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**06.<u>දෝපේ පෙර පාසලේ සෙල්ලම් මිදුලේ යකඩ ඔන්චිල්ලා අලුත්වැඩියා කිරීම සඳහා ගැල්වනයිස් දම්වැල් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>**

මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/07/23 - 2025/07/31

| අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | නිව් ජයමාල් හාඩ්වෙයාර්, අඹගහහන්දිය, දර්ගා නගරය. (රු.) | නිව් හාඩ්වෙයාර් ට්‍රේඩර්ස්, අංක 26, වැලිපැන්න පාර, අළුත්ගම. (රු.) | අස්ෆැක්ස් ට්‍රේඩ් සෙන්ටර්, අංක 15, මතුගම පාර, දර්ගා නගරය. (රු.) |
|---|---|---|---|---|
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 1"ප්‍රමාණයේ ගැල්වනයිස් දම්වැල් | අඩි 40 | 1kg – 850/= 1kg - අඩි 07 | 1kg – 900/= 1kg - අඩි 07 | 1kg – 900/= 1kg – 1ft |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03 ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුණි. මිල ගණන් සලකා බැලූ කමිටුව අදාළ ආයතන අතුරින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ දර්ගා නගරය, අඹගහ හන්දිය ලිපිනයේ පිහිටි නිව් ජයමාල් හාඩ්වෙයාර් වෙතින් 1" ගැල්වනයිස් දම්වැල් 1kg රු. 850/= බැගින් අඩි 40 ප්‍රමාණයට සරිලන පරිදි 6kg ක් රු. 5,100/= ක මුදලකට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**07.** <u>සභාව සතු **PF-7388** ඩබල් කැබ් රථයට සහ **RD-4484** ට්‍රැක්ටර් රථය සඳහා අවශ්‍ය ටයර් සහ ටියුබ් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>
මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/07/14 - 2025/07/28

බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් PF-7388 ඩබල් කැබ් රථයට සහ RD-4484 ට්‍රැක්ටර් රථය සඳහා අවශ්‍ය ටයර් හා ටියුබ් මිලදී ගැනීම සඳහා සභාවේ ලියාපදිංචි ආයතන වෙතින් මිල ගණන් කැඳවූ අතර ඒ සඳහා ආයතන 07 ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අදාළ මිල ගණන් ඉදිරිපත් කර තිබූ එක් එක් ආයතන විසින් විවිධ නිෂ්පාදිත මාදිලියන්ගෙන් යුත් ටයර් වර්ග කීපයක් සඳහා වෙන් වෙන් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එම ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ටයර් වර්ගයන් පිළිබඳ සැලකූ කමිටුව ඩබල් කැබ් රථය සඳහා වෙළඳපොලේ ඉහල ගුණාත්මකතාවයක් හිමිකරගෙන ඇති ජපානයේ නිශ්පාදිත "Yokohama" ටයර් මාදිලිය සඳහා අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සලකා බැලීමට තීරණය කරන ලදි. එමෙන්ම RD-4484 ට්‍රැක්ටර් රථය සඳහා අවශ්‍ය ටයර් හා ටියුබ් වෙනුවෙන් දේශීය වෙළඳපොලේ ගුණාත්මකභාවයක් හිමිකරගෙන තිබූ CEAT ටයර් මාදිලිය සඳහා අදාළ ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සලකා බැලීමට තීරණය කරන ලදි. ඒ අනුව අදාළ මිල ගණන් පහත පරිදි තෝරා ගන්නා ලදි.

| අවශ්‍ය ටයරයේ ප්‍රමාණය හා අවශ්‍ය සංඛ්‍යාව වගකීම් කාල සීමාව | **STC, Matara** | **S.K.M. Tyres PVT LTD, Kohuwala, Nugegoda** | **Perera Tyre Service (PVT) LTD, 773/1, Talangama , Malabe.** | **Universal Tyres PVT LTD, 1043/1, Maradana Rd, Borella.** | **Crown Tyre PVT LTD, Sirimavo Bandaranayaka Mawatha, Colombo 14.** | **Dharmasiri Tyre House PVT LTD, No 35/7, Shop place, Kaduruwela, Polonnaruwa.** | **Sasidu Motors, Galle Rd, Athuruwella, Induruwa.** |
|---|---|---|---|---|---|---|---|
| **265X70X16** ටයර් **04** **Yokohama Japan.** | 81,243/= (with vat) 40,000 km | 61,950/= (with vat) 4,000 km (Go39 Japan) | 61,006/= (with vat) 35,000 km | 62,245/= (with vat) 45,000 km | - | - | - |
| **12X4-28** ටයර් **04** **CEAT** | 76,936/= (6PR) (with vat) 78,942/= 12PR (with vat) | 72,443.33 (12 PR) (with vat) 70,543.00 6PR (with vat) | - | 75,502.30 (6 PR) (with vat) 77,467.00 (12 PR) With vat | - | 73,000 (with vat) | 75,500 (with vat) |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **12X4-28 ටියුබ් 04 CEAT** | - | - | - | - | - | - | 10,400 (with vat) CEAT |
| **600X16 ටයර් 02 CEAT** | 22,420 (8PR) (with vat) | 20,563.10 (8PR) (with vat) 26,751.30 6PR With vat | - | 23,069.00 (8PR) (with vat) | - | - | 23,400 (with vat) |
| **600X16 ටියුබ් 02 CEAT** | - | 4,080.71 (with vat) | - | - | - | - | 3,900.00 (with vat) |

පිටු අංක 06 සඳහන් පරිදි ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගත් ටයර් නිශ්පාදිත මාදිලියන් සඳහා පිටු අංක 07 අනුව එක් එක් ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සලකා බැලීමෙන් අනතුරුව 265×70×16 ප්‍රමාණයේ "Yokohama" වර්ගයෙන් යුත් ජපානයේ නිශ්පාදිත 45,000 km වගකීම් කාලයක් ලබාදී ඇති නුගේගොඩ, කොහුවල, S.D.S. ජයසිංහ මාවත, අංක 56/A ලිපිනයේ පිහිටි S.K.M. ටයර්ස් (පුද්.) සමාගම විසින් වැට් සහිතව එක් ටයරයක් රු. 61,950/= බැගින් ටයර් 04 ක් රු. 247,800/= ක මුදලකට මිලදී ගැනීමටත්, එම ආයතනය වෙතින්ම 12.4/11×28 ප්‍රමාණයේ 6PR Ceat ටයර 01 ක් වැට් සහිතව රු. 70,543/= බැගින් ටයර් 02 ක් රු. 141,086/= මුදලකටත්, 600×16 8PR ප්‍රමාණයේ ටයර් 01 ක් වැට් සහිතව රු. 20,563.10 බැගින් ටයර් 02 ක් රු. 41,262.20 මුදලකට මිලදී ගැනීමටත් ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

<u>ටියුබ් මිලදී ගැනීම</u>

12.4/11×28 ප්‍රමාණයේ ceat වර්ගයේ ටියුබයක් සඳහා අවම මිල වූ එක් ටියුබයක් රු. 10,000/= (වැට් සහිතව) බැගින් ටියුබ 02 ක් රු. 20,800/= කටත්, 600×16 ප්‍රමාණයේ ceat වර්ගයේ ටියුබයක් සඳහා අවම මිල වූ එක් ටියුබයක් (වැට් සහිතව) රු. 3,900/= කට ටියුබ 02 ක් රු. 7800/= මුදලකට ඉඳුරුව, අතුරුවැල්ල, ගාලුපාර ලිපිනයේ පිහිටි සසිඳු මෝටර්ස් ආයතනය වෙතින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**08.** <u>**බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීම හා බිම් මහලේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම**</u>

මිල ගණන් කැඳ වූ කාල සීමාව - 2025/05/02 - 2025/05/16

බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීම සහ බිම් මහලේ අලුත්වැඩියාවන් සිදු කිරීමට අදාළ ව්‍යාපෘතියේ ලංසු ඇගයීම් කමිටු සභාපති දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු විසින් අංක 3/8/සභා අරමුදල් හා 2025/05/22 දිනැතිව යොමු කර ඇති ලංසු ඇගයීම් වාර්තාව ඉදිරි කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව උක්ත ව්‍යාපෘතිය සඳහා අම්බලන්ගොඩ, වතුගෙදර, කුරුඳුවත්ත, නො.05 ලිපිනයේ පවත්වාගෙන යන රත්නතුංග කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද වැට් රහිත වටිනාකම වන රු. 7,329,960.00 ක් වූ ලංසුව තෝරාගැනීම සුදුසු බවට නිර්දේශ කර ඇති නමුත් මේ වන විට සභාව සතු මූල්‍ය තත්ත්වය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල දැරිය නොහැකි බැවින් මෙම මිල ගණන් ලංසුව අවලංගු කිරීමටත්, ඒ වෙනුවට ඉදිරියේදී ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සහ බිම් මහලේ අත්‍යවශ්‍යයෙන්ම සිදුකළ යුතු අලුත්වැඩියාවක් තෝරාගෙන අවම පිරිවැයක් සහිතව එම කටයුතු සිදු කිරීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. කේ.ඩී.මීගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
7. උඩබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී

**(උ)(4). <u>2025.08.06 දින ප.ව. 02.00 ට පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පුස්තකාල උපදේශන කමිටු රැස්වීම් වාර්තාවයි.</u>**

සහභාගිත්වය

අති පූජ්‍ය පරේගම චන්ද්‍රාලෝක නාහිමි - විහාරාධිපති, ශ්‍රී ධර්මාරාම විහාරය,බෙන්තොට.
ප්‍රේම කුමාර විජේවර්ධන මහතා -ගරු සභාපති,බෙන්තොට ප්‍රාදේශීය සභාව
පී.ලෙනිකා දුශාන්ති මිය - ගරු මන්ත්‍රිනී, බෙන්තොට ප්‍රාදේශීය සභාව
ලියනගමගේ අභයරත්න - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව
යූ.කේ.මධුභාෂිකා දිල්හානි මිය - ගරු මන්ත්‍රිනී, බෙන්තොට ප්‍රාදේශීය සභාව
ජයරත්න ඉඳුරුවගේ මහතා - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව
ආර්.කේ.ආර්.ලැනරෝල් මහතා -කමිටු සාමාජික,රන්තොටුවිල,බෙන්තොට
ඇම්.පී.මුනිදාස මහතා -කමිටු සාමාජික,කයිකාවල, ඉඳුරුව
කේ.කේ.ජී.බී.කන්නන්ගර මිය -කමිටු සාමාජික, ඇලකාක, හබුරුගල
ඩී.වී.තරංගි මිය -ප්‍රජා සංවර්ධන නිලධාරි,බෙන්තොට ප්‍රාදේශීය සභාව
ටී.ඒ.එම්.ගුණරත්න මිය -පුස්තකාලයාධිපති, හබුරුගල මහජන පුස්තකාලය
ඒ.එච්.හර්ෂි කාංචනා මිය - පුස්තකාලයාධිපති,ඉඳුරුව මහජන පුස්තකාලය
ජී.අයි.කුමාරසිංහ මිය -පුස්තකාල සහයිකා, බෙන්තොට මහජන පුස්තකාලය
එච්.ඒ.අයි.සුමුදු -පුස්තකාල සහයිකා, ගෝනගල මහජන පුස්තකාලය
යූ.කේ.ප්‍රදීපා ලක්මාලි මිය -පුස්තකාල සහයිකා,ඉඳුරුව මහජන පුස්තකාලය
ජේ.ජී.පී.වජිරාණි මිය -පුස්තකාල සහයිකා,බෙන්තොට මහජන පුස්තකාලය
ඩබ්ලිව්.ජී.එල්.නිමන්තිකා මිය - පුස්තකාල සහයිකා,ඉඳුරුව මහජන පුස්තකාලය

- පුස්තකාල ප්‍රගති වාර්තාව.

**<u>පුස්තකාල ප්‍රගති වාර්තාව</u>**
**<u>2025 ජූලි මාසය</u>**

| පුස්තකාලයේ නම | පොත් සංඛ්‍යාව | සමාජික සංඛ්‍යාව (2025.07.31 දිනට) | | මුළු සාමාජික සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ළමා | වැඩිහිටි | ළමා සහ වැඩිහිටි |
| බෙන්තොට මහජන පුස්තකාලය | 14341 | 119 | 3177 | 3296 |
| හබුරුගල මහජන පුස්තකාලය | 9358 | 260 | 1726 | 1986 |
| ඉඳුරුව මහජන පුස්තකාලය | 9089 | 277 | 1149 | 1426 |

| | | | | |
|---|---|---|---|---|
| ගෝනගල මහජන පුස්තකාලය | 3317 | 218 | 319 | 537 |

**පොත් නිකුත් කිරිම.**
**2025 ජූලි මාසය**

| පුස්තකාලයේ නම | ළමා | ප්‍රබන්ධ | විවිධ | ඉංග්‍රීසි | එකතුව |
|---|---|---|---|---|---|
| බෙන්තොට මහජන පුස්තකාලය | 130 | 844 | 101 | 10 | 1085 |
| හබුරුගල මහජන පුස්තකාලය | 107 | 753 | 147 | 07 | 1014 |
| ඉඳුරුව මහජන පුස්තකාලය | 221 | 510 | 140 | 08 | 879 |
| ගෝනගල මහජන පුස්තකාලය | 51 | 441 | 19 | 10 | 521 |

**පුස්තකාල කමිටුවේ නිර්දේශයන් ලබාදෙන ලද තීරණ හා යෝජනා.**

- පුස්තකාල ළමා පාඨකයන්ගේ වැඩිවීමේ ප්‍රවණතාවය ඉතා අඩු මට්ටමක පවතින බැවින් ළමා පාඨකයන් අරමුණු කරගනිමින් පුස්තකාල මට්ටමින් වැඩසටහන් සංවිධානය කිරීම.

- පාසල් මගින් පමණක් නොව දහම් පාසල් මගින් ද පුස්තකාල පාඨකයන් වැඩිකර ගැනීම සඳහා දැනුවත් කිරීම් සිදු කිරීම. විශේෂයෙන්ම ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරි ස්වාමින් වහන්සේ ලිඛිතව දැනුවත් කරමින් සිසු නිපුණතා ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ප්‍රාදේශීය සහා පුස්තකාල පිළිබඳ දහම් පාසල් දැනුවත් කිරිමට කටයුතු කිරීම හා ඉන් අනතුරුව දහම් පාසල් වෙත ද ගොස් අදාළ දැනුවත් කිරීම් සිදුකිරීම.

- ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රල්ඛ 2004/පුස/02(අ)සංශෝධිත 2005 හා පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/2/පුස්තකාල සංවර්ධන හා 2025.06.16 දිනැති ලිපිය ප්‍රකාරව ජාතික කියවීමේ මාසය අරමුණු කරගනිමින් චිත්‍ර, රචනා, විවාද, ජන ගායනා සහ කාව්‍ය නිර්මාණය තරගාවලියක් පවත්වා ජයග්‍රාහක,ජයග්‍රාහිකාවන් අගයමින් ත්‍යාග හා සහතිකපත් ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට හා එම වැඩසටහනට අදාළ වැය ඇස්තමේන්තුව මාසික සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- මෙම තරගාවලියේ ප්‍රථම ස්ථානය සඳහා රු.3000.00, දෙවන ස්ථානය සඳහා රු.2500.00 තෙවන ස්ථානය සඳහා රු.2000.00 හා සැනසිලි ත්‍යාග සඳහා රු.1000.00 වටිනා කමින් යුත් අභ්‍යාසපොත් හෝ තිළිණපත් ලබා දීම හා තරග විනිශ්චය වෙනුවෙන්විනිසුරු දීමනා ලෙස රු.2000.00 මුදලක් ලබා දිම.

- ත්‍යාග ප්‍රදානෝත්සව දින වැඩසටහන සඳහා ගීත රසාස්වාදය පිළිබඳ වැඩසටහනක් ද ඇතුළත් කිරීම.

- පුස්තකාල මට්ටමින් වසරේ හොඳම ළමා හා වැඩිහිටි පාඨකයා තෝරා ත්‍යාග ප්‍රදානය කිරීම.

- සාහිත්‍ය හා ජාතික කියවීමේ මාස තුළ පුස්තකාල සාමාජිකත්වය නොමිලේ ලබා දීම.

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ආබාධිත පුද්ගලයන් සඳහා පුස්තකාල සාමාජිකත්වය නොමිලේ ලබාදීම

**<u>පුස්තකාල මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්</u>**

**<u>බෙන්තොට මහජන පුස්තකාලය</u>**

- වැඩිහිටි පාඨකයන් අරමුණු කරගනිමින් රසවින්දනාත්මක හා විනෝදාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම.
- ළමා ජනමාධ්‍ය හා සන්නිවේදනය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්විම.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් කතන්දර පැය වැඩසටහනක් හා දෙමාපියන් වෙනුවෙන් ධනාත්මක හා ආකල්ප සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- ''පොතට වේලාවක්'' තේමා කරගනිමින් තෝරාගත් පාසලක් වෙත පොත් රැගෙන ගොස් දරුවන්ට කියවීමට අවස්ථාව සලසා දිම. (පුස්තකාල පහසුකම් නොමැති හෝ අවම පහසුකම් සහිත)

**<u>හබුරුගල මහජන පුස්තකාලය</u>**

- පුස්තකාල පාඨකයන් වෙනුවෙන් කියවීමේ කඳවුරක් පැවැත්වීම.
- සාහිත්‍ය පොත පත ඇසුරින් ''දසපැන'' ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පැවැත්වීම.
- පාඨකයන්ගේ නිර්මාණශීලි අදහස් බිත්ති පුවත්පත මගින් ප්‍රදර්ශනය කිරීම හොඳම නිර්මාණ අගය කරමින් ත්‍යාග ප්‍රදානයන් සිදු කිරීම.
- ''පොතපත සුරකිමු'' තේමාව අරමුණු කරගනිමින් පාඨකයන් දැනුවත් කිරීම හා පාඨකයන්ගේ සහභාගීත්වයෙන් කැඩී ඇති පොත් බැඳුම්කරණය කිරීම.
- තුන්දූව මුස්ලිම් විද්‍යාලයේ දරු දැරියන් සඳහා කියවීම් ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම හා පුස්තකාල සඳහා පොත් මිල දි ගැනීමේ දී එම දරුවන්ගේ ග්‍රන්ථ අවශ්‍යතාවයන් පිළිබඳ අවධානය යොමු කර ග්‍රන්ථ මිලදී ගැනිමට කටයුතු කිරීම.
- මුල් ළමාවිය දරුවන් වෙනුවෙන් කතන්දර පැය වැඩටසහන් සහ දෙමාපියන් වෙනුවෙන් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**<u>ඉඳුරුව මහජන පුස්තකාලය</u>**

- පාසල් දරු දැරියන් වෙනුවෙන් සොඳුරු යොවුන්විය පිළිබඳ මනෝ උපදේශන වැඩසටහනක් පැවැත්වීම.
- ලෝක ළමා දිනය තේමා කරගනිමින් පෙර පාසල් දරු දැරියන් වෙනුවෙන් චිත්‍ර ඇඳිමේ වැඩසටහනක් පැවැත්වීම.
- පුස්තකාල පාඨකයන් වෙනුවෙන් A4 කොළ භාවිතා කරමින් අත්කම් නිර්මාණකරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

**<u>ගෝනගල මහජන පුස්තකාලය</u>**

- 1-5 ශ්‍රේණි දරුවන් සඳහා චිත්‍ර කඳවුරක් පැවැත්වීම.
- ගෝනගල ළමා නිවාසයේ දරුවන්හට නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දීම හා එම දරුවන් වෙනුවෙන් ජංගම පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීම.

- ''පොත්පත් හා ජංගම දුරකතනය'' යන තේමාව යටතේ පාඨක ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

ඉහත නිර්දේශයන් ලබා දෙන ලද යෝජනා හා තීරණ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි

**(උ)(5). <u>2025.08.06 දින ප.ව. 03.30 ට පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාවයි.</u>**

**සහභාගීත්වය -**

| | |
|---|---|
| ප්‍රේමකුමාර විජයවර්ධන මහතා | -ගරුසභාපති, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| නදීශාන් වික්‍රමරත්න මහතා | -ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| එම්.ඩී.නිලුපුල් සම්පත් මහතා | - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| එල්.ජී.අබේරත්න මහතා | - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| ඩී.එන්.කේ.දේශප්‍රිය මහතා | - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| ඉඳුරුවගේ ජයරත්න මහතා | - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| ඩී.වී.තරංගි | - ප්‍රජා සංවර්ධන නිලධාරි, බෙන්තොට ප්‍රාදේශීය සභාව |

**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශයන්, ලබා දෙන ලද තීරණ හා යෝජනා**

01. සභාවක් මගින් සිදුකරනු ලබන මහා මාර්ග ,වීථි පහන්, කසළ බැහැර කිරීම වැනි කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් දුප්පත් ජනතාව වෙනුවෙන් විශාල කාර්යයක් මෙම කමිටුව හරහා සිදුකළ හැකි බව එහි විෂය පථය පිළිබඳ සැලකිළිමත් වීමේ දී පෙනීයන බැවින්, ඉදිරි අයවැය මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කර 2026 වර්ෂයේ සිට වැඩසටහන් යෝජනා කර ක්‍රියාත්මක කිරීම සුදුසු බව.

02.බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ සනීපාරක්ෂාව ඉහළ නැංවීමේ අරමුණින් වැසිකිළි පහසුකම් නොමැති පවුල් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ලබා ගන්නා ලද නාම ලේඛනය පදනම් කර ගනිමින් මෙම වර්ෂය සඳහා පවුල් 13කට වැසිකිළි ඉදිකර ගැනීමට එක් පවුලකට රු.50,000.00 වටිනා උපකරණ හා ද්‍රව්‍ය ලබා දීමට (ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියේ xxiii ප්‍රකාරව) 2025 අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවද මේ දක්වා එම කාර්යය සිදු කර නොමැති බැවින් පවත්නා ප්‍රතිපාදන හා කාලය පිළිබඳ සැලකිලිමත් වෙමින් ඉදිරිකාලය තුළ කිසිදු දේශපාලනමය මැදිහත් වීමකින් තොරව සුදුසුම පවුල් හයක් සඳහාවත් වැසිකිළි ඉදිකර ගැනීමට කටයුතු සලසා දීම සුදුසු බවට නිර්දේශ කිරීම.

03.බෙන්තොට ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන කුඩා ඌරගහ පෙර පාසල කුඩා ඌරගහ ක්ෂේත්‍රාරාම විහාරස්ථාන ධර්මශාලාවේ පවත්වා ගෙන යනු ලබන අතර එම ධර්මශාලාව ගමේ පොදු කටයුතු, රැස්වීම් පැවැත්වීම සඳහා ද යොදා ගන්නා බැවින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිදහසේ හා විධිමත්ව පවත්වා ගෙන යාමට බාධාවන් ඇතිවීම හා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පෙර පාසලක තිබිය යුතු පොදු ප්‍රමිතීන් පිළිබඳ පරීක්ෂා කර එහි අවම ප්‍රමිතීන්ට අනුව පෙර පාසල ඒ සඳහාම වෙන් වූ ගොඩනැගිල්ලක පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍යම වන බැවින්, දරුවන්ට වඩාත් නිදහස් හා විධිමත් ලෙස ක්‍රියාකාරකම් වල නිරත වෙමින් අධ්‍යාපන කටයුතු පවත්වා ගෙන යාමට හැකි ලෙස එම ප්‍රදේශයේ රජයේ ඉඩමක හෝ රජයේ ඉඩමක් නොමැති නම් ඉඩමක් මිල දී ගෙන හෝ පෙර පාසල සඳහා

ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සුදුසු බව හා එම බල ප්‍රදේශය නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් තිදෙනෙක් මෙම සභාවේ සිටින බැවින් එම මන්ත්‍රීවරුන් මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස අවධාරණය කිරීම.

04.මල්මඩුවාකන්ද පෙර පාසල සඳහා අලුතින් ඩෙස්ක් 02ක් සහ පුටු 20ක් ලබා දීමට මුදල් කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර එම කාර්යය ඉටු කර දීම සුදුසු බව.

05.පළාත් පාලන කොමසාරිස්ගේ අංක වැය අනුමැතිය පොදු 2024 හා 2025.03.20 දිනැති ලිපියෙන් දැනුවත් කරන ලද පරිදි හා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අංක GS/SP/ADM/03/09/01 හා 2025.06.12 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දෙන ලද බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් සඳහා වන සංගීත චිකිත්සක හා දැනුවත් කිරීමේ වැඩසටහන මෙම මාසය තුළ පැවැත්වීම හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සමග සාකච්ඡා කර සුදුසු දිනයක් හා ස්ථානයක් යොදා ගැනීම සුදුසු බව.

06.සභාව සතු සුසාන භූමි බොහෝමයක් වල් බිහි වී ඇති බැවින් එම සුසාන භූමි ශ්‍රමදාන මඟින් පිරිසිදු කිරීම සුදුසු බව.

ඉහත නිර්දේශ ලබා දෙන ලද තීරණ හා යෝජනා ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**(ඌ).** **<u>ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශය එකතු කල ආදායම් පිළිබඳ ප්‍රකාශ වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම සලකා බැලීම.</u>**

(ඌ)(1). 2025 ජූලි මස මස ලැබීම් හා ගෙවීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| 2025 ජූලි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 9,765,922.73 |
| එකතු කලා මූලධන ලැබීම් :- | රු. 5,027.37 |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 9,770,950.10** |
| බලපත්‍ර බදු | රු. 13,375.00 |
| සේවක ණය | රු. 775,899.30 |
| තැන්පත් | රු. 146,682.00 |
| දේපළ ණය පොළී | රු. 9,560.68 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 77,654.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 2,950.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | රු. 91,010.00 |
| 101 ට බැර | රු. 33,083.00 |
| 201 ට බැර | රු. 31,000.00 |
| එකතුව | **රු. 10,952,164.08** |
| 2025 ජූලි මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 10,976,474.82 |
| එකතු කලා -ප්‍රාග්ධන වියදම් | රු. 440,746.01 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 11,417,220.83** |
| දේපළ ණය පොළී | රු. 14,685.88 |

| | |
|---|---|
| තැන්පත් | රු. 113,519.87 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 38,273.24 |
| මුද්දර බදු | රු. 30,965.00 |
| ණය හිමියෝ | රු. 217,639.20 |
| සේවක ණය | රු. 1,409,788.00 |
| එකතුව | **රු. 13,242,092.02** |

2025 ජුලි මස ලැබීම් හා ගෙවීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඌ)(2). <u>2025.07.31 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.07.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරණ පොදු ජංගම ගිණුම, අංක 81618288 දරණ සේවක ණය ගිණුම යන බැංකු ගිණුම්වලට අදාල බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම බැංකු සැසඳුම් වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඌ)(3). <u>2025.07.31 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.07.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2025 ජුලි මස බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඌ)(4). <u>ලිපි අංක 01</u>**

කේ. ඩී. කේ. සී. ජී. කාරියවසම් මහතා විසින් 2025.07.25 දිනැතිව “හිඟ වරිපනම් බදු මුදල් එකතු කිරීමේ දී මුදල් ලබා ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන්” යන මැයෙන් එකතු කරන ලද මුදල් සඳහා නියමිත කොමිස් මුදල ලබා දීමට කටයුතු කරන ලෙසත් පෙර තිබූ චක්‍රලේඛය පරිදි බදු මුදල් එකතු කිරීමට අවස්ථාව දෙන ලෙසත් ඉල්ලීම් කර ඇති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මේ සම්බන්ධව චක්‍රලේඛයක් නිකුත් කරලා තිබුණා පළාත් පාලන කොමසාරිස් විසින් දේපළ තහනම් කරන නිලධාරීන්ට ඔවුන්ට ලබා දෙන මුදලින් 75% ක් එකතු නොකරන්නේ නම් ඔවුන්ට අයිති කොමිස් මුදල ලබා දෙන්නේ නෑ කියලා. ඒ නිසා ඒ සම්බන්ධව මම පුද්ගලිකව පළාත් පාලන කොමසාරිස්තුමිය හා ප්‍රධාන විමර්ශන නිලධාරීතුමන් සමඟ කළ සාකච්ඡාවක දී දැනුම් දුන්නා චක්‍රලේඛයෙන් පිට කටයුතු නොකරන පරිදි දේපළ තහනම් කරන නිලධාරියාට කොටස් වශයෙන් හිඟ බදු මුදල් අයකළ යුතු පාරවල් ලැයිස්තු ගත කොට ලබා දෙන ලෙසත් ගෙවිය යුතු බදු මුදල් සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කොට ඇති දේපළ එම ලැයිස්තුවෙන් කපා හැර ලබා දෙන ලෙසත්.

ඒ අනුව චක්‍රලේඛයෙන් පිට කටයුතු නොකරන පරිදි දේපළ තහනම් කරන නිලධාරියාට කොටස් වශයෙන් මාර්ග බෙදා දී එම එකතු කරනු ලබන හිඟ මුදලින් 75% ක් ලබා දීමට තීරණය කරන ලදී.

**(ඌ)(5).** **<u>ලිපි අංක 02</u>**

වැඩ ක්ෂේත්‍ර පරිපාලක කේ. ඕ. කේ. රවී මහතා විසින් 2025.08.11 දිනැතිව "ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල යෙදීම සඳහා වන ඉන්ධන දීමනාව ලබා ගැනීම සම්බන්ධයෙනි" මැයෙන් යුතුව ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

වැඩ පරිපාලකතුමා තමන්ගේ පෞද්ගලික යතුරු පැදියෙන් තමයි සියලු දේ අධීක්ෂණය සඳහා ගමන් කරන්නේ. මීට පෙර වැඩ පරීක්ෂක තනතුරේ වැඩ ආවරණය කරන කාලෙත් රු. 3,000/- ක දීමනාවක් ලබා දීලා තියෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා රු. 5,000/- ක ඉන්ධන දීමනාවක් ඒ මහතාට ලබා දීම සුදුසුයි කියලා.

ඒ අනුව වැඩ පරීක්ෂක කේ. ඕ. කේ. රවී මහතා සඳහා රු. 5,000/-ක මාසික ඉන්ධන දීමනාවක් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

**(ඌ)(6).** **<u>ලිපි අංක 03</u>**

2025.08.18 දිනැතිව ආ/03 විෂය භාර නිලධාරී විසින් "මාලවල ග්‍රාමීය ලේකම් කාර්යාලයේ විදුලි බිල සම්බන්ධවයි" මැයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

අංක 13 බී, මාලවල ප්‍රජා ශාලා ගොඩනැගිල්ල අප සභාවට අයත් ඉඩමක පිහිටා ඇති නමුත් එය මේ වන විට භාවිත කරනු ලබන්නේ එම වසමේ ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී ඇතුළු පිරිසක්. එම පිරිසට මාසිකව කාර්යාල දීමනාවක් ලැබෙනවා. එම මුදලින් මෙම ගොඩනැගිල්ලේ මාසික විදුලි බිල ගෙවීමේ හැකියාවක් එම නිලධාරීන්ට පවතිනවා. අවස්ථා දෙකක දී පමණ අපි මේ සම්බන්ධව විගණනයටත් ලක් වෙලා තියෙනවා. ඒ නිසා පසුගිය කොමසාරිස්තුමියගේ පාලන කාලයේ දී තීරණයක් අරන් තියෙනවා 2023 වර්ෂයේ නොවැම්බර් මස තෙක් මෙම ප්‍රජා ශාලාවේ හිඟ විදුලි බිල්පත් ගෙවා අවසන් කොට දෙසැම්බර් මස සිට ගෙවීම් නැවැත්වීමට. ඒ බව අදාළ ආයතන වෙත දැනුවත් කිරීමකුත් සිදු කරලා තියෙනවා. නමුත් ඉන් ඉදිරියටත් එම ආයතන බිල්පත් ගෙවීම මඟ හැරීම නිසා නැවත හිඟ මුදලක් එකතු වෙලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමා එම හිඟ මුදල් ගෙවන ලෙස අපෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. නමුත් අපිට ගෙවීමේ හැකියාවක් නෑ. නැත්නම් අපි ආපහු විගණනයට ලක් වෙනවා.

එම හිඟ බිල්පත් නොගෙවීමට කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා ප.ව. 01.15 ට සභා ගර්භයෙන් පිටව ගියේ ය.

**(ඖ)(7). <u>ලිපි අංක 04</u>**
මගේ අංක SP/Edumin/PL/04/E හා 2025.07.11 දිනැතිව "ගා/ කොබෙයිදූව ප්‍රාථමික විද්‍යාලය - ප්‍රවේශ මාර්ගය සැකසීම" මැයෙන් දකුණු පළාත් අධ්‍යාපන නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 01.15 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

එහි දී එම භූමියේ අයිතිය පිළිබඳව හා ලිපියට අදාළව කළ හැකි ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඒ අනුව සභාවට අයිති භූමියක් නොවන බැවින් තාර හෝ කොන්ක්‍රීට් යොදා මාර්ගය සකස් කිරීමේ හැකියාවක් නොමැති බැවින් සභාවේ බැකෝ යන්ත්‍රය නැවත අලුත්වැඩියා කර ලබා ගැනීමෙන් අනතුරුව බැකෝ යන්ත්‍රය ආධාරයෙන් එම මාර්ගය එළිපෙහෙළි කර දීමට තීරණය විය.

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව අහෝසි කිරීමට කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 01.20 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

**(එ). <u>වෙනත් කරුණු</u>**

**(එ)(1). <u>ටෙන්ඩර් මිළ ගණන් :-</u>** නැත

**(එ)(2). <u>ඇස්තමේන්තු ගිවිසුම් සභාගත කිරීම :-</u>** නැත

**(එ)(3). <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම:-</u>**

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
කසල අංගනය සහිත භූමියේ පසුගිය දිනක ඇති වූ ගින්න සම්බන්ධව අදහස් දැක්වීමට මම මේ අවස්ථාව යොදා ගන්නවා. මම ගින්න පිළිබඳ ආරංචිය දැනගන්න කොට බෙන්තර ප්‍රදේශයෙන් බැහැර හිටියේ. මට ආපසු ඒමට හැකියාවක් තිබුණේ නෑ. නමුත් උප සභාපතිතුමා ඒ සියලු වගකීම් කරට අරගෙන කටයුතු කරා. තාරක මන්ත්‍රීතුමා තමන්ගේ එක්ස්කැවේටර් යන්ත්‍රය රැගෙනවිත් තමන්ම යන්ත්‍රය හසුරුවමින් ගින්න නිවා දැමීමේ කටයුතුවලට සම්බන්ධ වුණා. ඒ වගේම නදීශාන් මන්ත්‍රීතුමා කකුලේ තුවාලයක් තියෙද්දිත් ගිනි ගොඩවල් උඩින් පැන පැන ගින්න නිවීමේ කටයුතුවලට සම්බන්ධ වුණා. උප සභාපතිතුමා බලපිටියෙන් හා බේරුවලින් ජල බවුසර් ලබා ගැනීමටත් පසුව ගෙවීමේ පදනම මත කඩිනමින් බැකෝ යන්ත්‍රයක් එම භූමියට යොමු කිරීමටත් කටයුතු කළා. පැය 01යි මිනිත්තු 35 ක් ඇතුළත මන්ත්‍රීවරුන්, තාක්ෂණ සේවා නිලධාරීන්, වැඩ පරීක්ෂකතුමා, බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සේවක මහතුන් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ සාමූහික කැපවීම මත මෙම ගින්න නිවා දැමීමට කටයුතු කර තිබුණා. නමුත් අපි හවස් වෙනකන්ම එම ස්ථානයේ රැඳී සිටිමින් නැවත ගින්නක් ඇති නොවීමට අවශ්‍ය සියලුම කටයුතු ඉටු කළා. ඒ හැම දෙනාටම මම මේ අවස්ථාවේ දී ස්තූතිවන්ත වෙනවා.

**<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**
මේ වෙලාවේ අසනීප තත්ත්වයෙන් පසුවෙන ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමාට මං නිදුක් නීරෝගී සුවය ප්‍රාර්ථනා කරනවා සියලු දෙනාම වෙනුවෙන්.

**(එ)(4). <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිඩාඩු අනුමත කිරීම:-</u>**

**<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දැක්වූ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ 20 දෙදෙනාටම ස්තුතිවන්ත වෙමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

ප.ව. 13.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

................................
ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව

**<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මස මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>**

**<u>සංශෝධන අංක 01 - ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන</u>**
2025.08.19 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 31 හි (ඊ)(2)(4) යෝජනාවට අදාළ සභා සම්මුතිය "යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය" යන්න වෙනුවට "ගෝනගල අංක 06 කඩ කාමරය රු. 1,250,000/- ක එක්වන් මුදලට රවීන්ද්‍ර ප්‍රසාද් ගැමුණු මහතාටත්, අංක 07 කඩ කාමරය රු. 1,250,000/- ක එක්වන් මුදලට චන්දිමා විජයන්ති මහත්මියටත් ලබා දීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය" යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>සංශෝධන අංක 02 - ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන</u>**
2025.08.19 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 64 හි පළමු ඡේදය වන (ඌ)(4) ලිපි අංක 01 ට අදාළ තීරණය "ඒ අනුව චක්‍රලේඛයෙන් පිට කටයුතු නොකරන පරිදි දේපළ තහනම් කරන නිලධාරියාට කොටස් වශයෙන් මාර්ග බෙදා දී එම එකතු කරනු ලබන හිඟ මුදලින් 75% ක් ලබා දීමට තීරණය කරන ලදී" යන්න වෙනුවට "ඒ අනුව චක්‍රලේඛයෙන් පිට කටයුතු නොකරන පරිදි දේපළ තහනම් කරන නිලධාරියාට කොටස් වශයෙන් මාර්ග බෙදා දී එම එක් එක් මාර්ගයට අදාළව එකතු කරනු ලබන හිඟ මුදල එම මාර්ගයේ එකතු කරනු ලැබිය යුතු මුදලින් 75% කට වඩා වැඩි වන්නේ නම් එම

නිලධාරියාට ලැබිය යුතු කොමිස් මුදල ලබා දීමට තීරණය කරන ලදී'' යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>**සංශෝධන අංක 03 - ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන**</u>

2025.08.19 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 64 හි (ඌ)(6) ලිපි අංක 03 ට අදාළ තීරණය ''එම හිඟ බිල්පත් නොගෙවීමට කළ යෝජනාවට අදාළ ප්‍රශ්න ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව විරුද්ධත්වයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය'' යන්න වෙනුවට ''ඒ අනුව, අංක 13 බී මාලවල ප්‍රජා ශාලා ගොඩනැගිල්ල සඳහා 2023 වර්ෂයේ නොවැම්බර් මාසයෙන් පසුව එකතු වී ඇති හිඟ විදුලි බිල්පත් නොගෙවීමට තීරණය කරන ලදී'' යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

....................................................

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,<br>
සභාපති,<br>
බෙන්තොට ප්‍රාදේශීය සභාව